# ශ්‍රද්ධා

අධ්‍යාපන ශිෂ්‍යත්ව

උත්සාහයෙන් වීර්යයෙන් ජීවිතය ජයගන්නට
වෙර දරනා පින්වන්ත දූ පුතුන් උදෙසා...

ශ්‍රී බුද්ධ වර්ෂ 2560
ව්‍යවහාර වර්ෂ 2017
ජනවාරි, පෙබරවාරි, මාර්තු




# නිදහස සොයා පියනගමු

පිටු අංක 47



## දහම් කැඩපත

අඳුර විනිවිද ආලෝකය දකින්නට

පිටු අංක 19



## බුදු පුදට

මල් වට්ටියක් හදමු

පිටු අංක 55



පිටු අංක 44

නිර්මාණ ඉසව්ව

ඇතුළු පිටු



පිටු අංක 12


චූල්ලතිස්ස තෙරුන්ගේ කථා වස්තුව



පිටු අංක 39

සෙනෙහෙබර ආමන්ත්‍රණය


www.shraddha.lk



ශිෂ්‍යත්වලාභී පින්වත් අමාෂා හර්ෂමාලි දියණියගේ සිතුවමක්...

මහා කාරුණික වූ ප්‍රඥාවෙන් අග්‍රේෂ්වර වූ සියලු දෙව් මිනිසුන් හට
විමුක්තියේ මාර්ගය විවර කළ ශ්‍රීමත් සුගත තථාගත ගෞතම සම්මා
සම්බුදුරජාණන් වහන්සේට අපගේ නමස්කාරය වේවා !



මහමෙව්නාව භාවනා අසපු සංචිතයේත්, ශ්‍රද්ධා මාධ්‍ය ජාලයේත්
නිර්මාතෘවර සහ ප්‍රධාන අනුශාසක
අතිපූජනීය කිරිබත්ගොඩ ඤාණානන්ද ස්වාමීන් වහන්සේ.

**ශ්‍රද්ධා අධ්‍යාපන ශිෂ්‍යත්ව පුණ්‍ය ව්‍යාපෘතිය සඳහා සෙනෙහසින් අවවාද අනුශාසනා කරමින් අපහට නිරතුරු මඟ පෙන්වන අපගේ ගුරුදේවෝත්තම කල්‍යාණ මිත්‍ර පින්වත් ලොකු ස්වාමීන් වහන්සේට අපගේ නමස්කාරය වේවා !**

ශ්‍රද්ධා රූපවාහිනිය
369, හේවාගම, කඩුවෙල.
දුරකථන : 0112 571 471
ෆැක්ස් : 0112 548 400
ඊ මේල් : info@shraddha.lk
වෙබ් : www.shraddha.lk

මහමෙව්නාව
භාවනා අසපුව

ශ්‍රද්ධා
රූපවාහිනිය

ලක්විරු
ගුවන්විදුලිය
LAKVIRU RADIO

අනේක දුක් කම්කටොලු මැද
උපයාගත් මුදල් තුටු සිතින් ම
ජීවිතය ජයගන්නට වෙර දරන
දැයේ දූ දරුවන්ට
මහත් සෙනෙහසින් දයාද කරන
දයාබර කැපකරු මා පියවරුන් සියලු දෙනා ද
අනේක දුක් කම්කටොලු මැද
ගුණයෙන් නුවණින් පිරිපුන් අනාගතයකට
පෙරමං තනන ශ්‍රද්ධා අධ්‍යාපන ශිෂ්‍යත්වලාභී
පින්වත් දරුවන් සියලු දෙනා ද
නිදුක් වෙත්වා ! නීරෝගී වෙත්වා ! සුවපත් වෙත්වා !
දුර්ලභව ලද මිනිස් ජීවිතය
නිමවන්නට මත්තෙන් ඉතා සුවසේ ම
උතුම් චතුරාර්ය සත්‍ය ධර්මය අවබෝධ කොට
මේ දුක්ඛිත සසර ගමනින්
නිදහස් වීමේ වාසනාව ලබත්වා!

ව්‍යවහාරික වර්ෂ 2017ක් වූ ජනවාරි මස 07 වැනි දින දී ය.

නමෝ බුද්ධාය !!!

දයාබර දුවේ පුතේ,

අලුත් ව්‍යවහාර වර්ෂයක, අලුත් පන්තියක තමයි මේ වෙද්දි ඔයාලගේ අධ්‍යාපන කටයුතු සිද්ධ කෙරෙන්නේ. ගිය අවුරුද්දට වඩා වැඩි වැඩ කොටසක්, වෙනස් ම වැඩ කොටසක් මේ වෙද්දි ඔයාලා හැමෝටම ලැබිලා ඇති. ඒ හැම දෙයක් ම උනන්දුවෙන්, උත්සාහයෙන් ඉෂ්ට සිද්ධ කළොත් තමයි දූලාපුතාලට සාර්ථකව අධ්‍යාපන කඩයිම් ජය ගන්න අවස්ථාව ලැබෙන්නේ.

ඕනෑම දෙයක් සාර්ථකව ඉටු කර ගන්න ලැබෙනකොට අප ජීවත්වන මේ සමාජය එය තවත් කාරණාවක් සමග නිතරම ගළපා ගන්නවා. ඒ තමයි 'වාසනාව'. නිදුක් නීරෝගීව සිටියත්, විභාගයක් උසස් ලෙස සමත් වුණත්, ලස්සන රූපයක්, ලස්සන කටහඬක් තිබුණත්, කරන කියන හැම දෙයම සාර්ථක වුණත් ඒ හැම තැනම 'වාසනාව' ඉස්මතු කිරීම අපට නුහුරු නුපුරුදු දෙයක් නෙමෙයි.

ඇත්තටම දුවේ පුතේ, වාසනාව නිසා සියලු සාර්ථකත්වයන් ලබන්නට ඉඩ සැලසෙනවා නම් 'වාසනාව' ඇති මිනිසුන් බවට පත්වන්නට අප කැමති විය යුතු ම යි නේ ද? දුවේ පුතේ, වාසනාව සහිත මිනිසුන් වීම කෙරෙහි බලපාන කරුණු තිබෙනවා. අන්න ඒ කරුණු අප තුළ තිබුණොත් තමයි අපටත් වාසනාවන්ත මිනිසුන් වන්න ඉඩ ලැබෙන්නේ.

අපි හැමෝම ලබපු ලොකු ම වාසනාවක් තමයි ගෞතම සම්බුද්ධ ශාසනය ලොව ජීවමානව පවතිද්දී ඒ උතුම් ශ්‍රී සද්ධර්මය ඇසෙන මායිමේ, සිහිනුවණ ඇතිව මිනිස් ජීවිතයක උපදින්න ලැබීම. මේ උපත අපට ලැබුණොත් හේතු සහිතව ම යි. දූලාපුතාලගේ ගෙවත්තේ ඉන්න තිරිසන් සතුන් ගණනයි, දුවගේ පුතාගේ පවුලේ සාමාජිකයන් ගණනයි සලකලා බැලුවොත් නිවසේ ඉන්න මිනිස්සු ගණන වගේ ලක්ෂ ගණනක් සතුන් ගෙවත්තේ ඉන්නවා. කුරා කුහුඹුවන්, මැසි මදුරුවන් ආදි ඒ සතුන් අපට ගණන් කරන්නටවත් බැරි තරම් අතිමහත්. දුවේ පුතේ, තිරිසන් අපායේ විතරක් නෙමෙයි; නිරයේ, ප්‍රේත ලෝකයේ, අසුර අපායේ ඔය වගේම ලක්ෂ, කෝටි, ප්‍රකෝටි ගණනින් සතුන් සිටිනවා. ගණනින් මෙපමණයි කියන්න බැරි තරම් වුණ පිරිසක් එහෙම අපාගතව දුක් විඳිද්දී අපි මිනිස් ලෝකයේ මෙහෙම ඉපදුණේ අහම්බයකින් නෙමෙයි. ඒ උපත අපට හිමි කර දුන්නේ අප විසින් සසරේ රැස් කළ පින නම් වූ කර්ම ශක්තිය යි.

දුවේ පුතේ, ඕනෑම ජීවිතයක් තුළ කර්මය කියන්නේ තීරණාත්මක බලවේගයක්. සියල්ල කර්මය මත සිදු නොවුණත් කර්මය විසින් ඉතා බලවත් ලෙස ජීවිත හසුරුවනවා. අප කරන කියන කටයුතුවල සාර්ථකත්වය අත්පත් කර ගන්නට උපකාර ලැබෙන්නටත් කර්ම ශක්තිය හේතු වනවා. 'වාසනාව' කියා අප හඳුන්වන මේ බලවේගය සසරේ රැස් කළ පින ලෙසත් හඳුන්වන්නට පුළුවනි.

අපගේ ශාස්තෘ වූ සම්මා සම්බුදුරජාණන් වහන්සේ නිධිකණ්ඩ නම් වූ උතුම් සූත්‍ර දේශනාවේ දී පෙන්වා වදාළේ මෙලොව සැප සලසන්නේ පින විසින් බව යි. ඒ වගේ ම පරලොව සැප සලසන්නේ ද පින විසින් බවයි. මේ ආකාරයෙන් දෙලොව සැප පමණක් නෙවෙයි, පරමෝත්තම වූ නිවන් සැප සලසන්නේ ද පින විසින් බව

සම්බුදුරජාණන් වහන්සේ එහි දී වදාළා. අප රැස් කරන පින සෑම කල්හි ම සැපය පිණිස පවතින බව අප එයින් තේරුම් ගත යුතු යි.

දුවේ පුතේ, පින වුවත් නිසි පල ගෙනෙන්නේ අප එය නිසි ලෙස යොදා ගතහොත් පමණයි. සම්බුදුරජාණන් වහන්සේ ජීවමානව වැඩ සිටිය දී කෝටි ගණනින් කහවණු ධනය තිබුණත් ඒ සියල්ල අහිමිව සිඟමනට වැටුණු මහධන සිටු යුවළ ගැන පුවත අප දන්නවා. ඔවුන් දෙදෙනා පෙර රැස් කළ පින අනුව තරුණ වියේ දී හෝ අඩුම තරමේ සිඟමනට වැටෙන්නට පෙර හෝ පැවිදි වූවා නම් මාර්ගඵල ලබන බව සම්බුදුරජාණන් වහන්සේ දේශනා කළා. එහෙත් ඔවුන්ට එයට පින තිබිය දී පවා එයින් පල ලැබිය නො හැකි වුණේ පින නිසි ලෙස භාවිත නො කළ නිසයි. දුවේ පුතේ, පිනක පල ප්‍රයෝජන ලබන්නත් අප උත්සාහයෙන්, වීර්යයෙන්, ගුණානුවණින් කටයුතු කිරීම කළ යුතු ම යි.

මේ කරුණ හොඳින් සිතේ දරාගෙන, මෙවන් උතුම් මිනිස් ජීවිතයක් ලබන්නට ඔබට උරුම වූ පින, සිත කය වචනයෙන් යහපතේ ම හැසිරෙමින් මේ ගෞතම සම්බුදු සසුනේ දී ම මහත්ඵල මහානිශංස කර ගන්නට ඔබට ද වාසනාව ලැබේවා!

ඔබට තෙරුවන් සරණයි!
මෙයට,
ගෞතම බුදු සසුන තුළ
මෙත් සිතින්,
අළුදෙණියේ සුබෝධි ස්වාමීන් වහන්සේ.
ශ්‍රද්ධා රූපවාහිනිය - ගුවන්විදුලිය.

# පටුන


01. චුල්ලතිස්ස තෙරුන්ගේ කථා වස්තුව 12

02. දහම් කැඩපත 19

03. සෙනෙහෙබර ආමන්ත්‍රණය 39

04. නිර්මාණ ඉසව්ව 44

05. නිදහස සොයා පියනඟමු 47

06. පුණ්‍යක්‍රියා 55

අමා දම්රස වෑහෙන විස්තරාර්ථ

# ධම්ම පදය

**(යමක වර්ගය)**

**පූජ්‍ය කිරිබත්ගොඩ ඤාණානන්ද**
**ස්වාමීන් වහන්සේ**



ථුල්ලතිස්ස තෙරුන්ගේ කථා වස්තුව

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මාසම්බුද්ධස්ස
**ඒ භාග්‍යවත් අරහත් සම්මා සම්බුදුරජාණන් වහන්සේට නමස්කාර වේවා!**

# ථුල්ලතිස්ස තෙරුන්ගේ කථා වස්තුව

## අවෛරයෙන්මයි වෛරය සංසිඳිලා යන්නේ

පින්වතුනේ, පින්වත් දරුවනේ,

අපේ බුදුරජාණන් වහන්සේ සම්බුද්ධත්වයෙන් පසුව කිඹුල්වත් නුවරට වැඩියා නෙ. තම පියාණන් වන සුද්ධෝදන රජතුමාටත්, තම පුංචි අම්මා වන ප්‍රජාපතී ගෝතමී දේවියටත්, තම බිසව වශයෙන් සිටි යසෝදරා දේවියටත්, රාහුල කුමරුටත්, අන් හැමටත් කරුණාවෙන් වැඩම කළ ගමනේදී ඇතිවුණ පැහැදීම නිසා බොහෝ දෙනෙක් පැවිදි වුණා.

ශාක්‍ය වංශය බුදුරජුන් උපන් පරපුරයි. ඒ වගේම කෝලිය වංශය මහාමායා දේවියගේ පරපුරයි. රෝහිණී ගංගාව ඒ ශාක්‍ය කෝලිය වංශ දෙකේම ජනපදවල සුවිශාල කුඹුරු යායවල් තෙත් කරමින් ගලා බසිනවා. ඉතින් ඇතැම් ග්‍රීෂ්ම ඍතුවල දී රෝහිණී ගංගාවේ ජලය සිඳෙනවා. එතකොට ඔවුන් ඒ ජලය බෙදා ගැනීමට ගන්නා උත්සාහයේ දී ඇතැම් විට කලකෝලාහල හටගන්නවා. එවැනි කෝලාහලයක් හටගැනීමට සූදානම් වෙද්දී බුදුරජාණන් වහන්සේ එයට මැදිහත් වුණා. අඬදබර සංසිඳෙව්වා. සාමය ඇති කළා. ඒ සතුටට ශාක්‍ය කෝලිය වංශ දෙකෙන් කුමාරවරු පන්සියය බැගින් මහණ වුණා. බුදුරජාණන් වහන්සේගේ නැන්දා කෙනෙකුගේ පුතෙක් හිටියා. ඔහුගේ නම තිස්ස කුමාරයා. මාලිගාවේ සැපට හැදුණු තරබාරු ඇඟක් තියෙන මේ තිස්ස කුමාරයාත් පැවිදි වුණා. රජකුලයෙන් පැවිදි වුණ නිසා ඔහු හරි ආඩම්බරයි. තරබාරු නිසා කවුරුත් හැඳින්වුයේ ථුල්ලතිස්ස කියලයි. ''ථුල්ල'' කියන්නේ ස්ථූල කියන එකයි. මේ ථුල්ලතිස්ස ස්වාමීන් වහන්සේ කාටවත් ගරුසරු කරන්නේ නැහැ. බුදුරජාණන් වහන්සේගේ ඥාතිකම හිතට අරගෙන වත්පිළිවෙත් නොකර මහ තෙරුන් වහන්සේලා වාඩිවෙන පුටුවල වාඩිවෙලා සැදැහැවතුන්ගෙන් සැළකිලි ලබමින් සතුටු වෙනවා.

දවසක් ඉතා සිල්වත් ගුණවත් උතුම් ස්වාමීන් වහන්සේ නමක් වැඩම කළා. ඒ වෙලාවේ ථුල්ලතිස්ස ස්වාමීන් වහන්සේ ලොකු පුටුවක වාඩිවෙලා ගාම්භීර ලීලාවෙන් සිටියා. අර උතුම් ස්වාමීන් වහන්සේ හිතුවේ වැඩිහිටි මහතෙර නමක් කියලයි. ඉතින් ථුල්ලතිස්ස ස්වාමීන් වහන්සේ ළඟට වැඩියා. එතකොටවත් නැගිට්ටේ නැහැ. ගරුසරු කළේ නැහැ. ඒ උතුම් ස්වාමීන් වහන්සේ ඇහුවා 'ඔබවහන්සේට දැන් වස් කීයක් වෙනවද?' කියලා. එතකොට ථුල්ලතිස්ස ස්වාමීන් වහන්සේ වහා නැඟිට තමන්ගේ ලාබාලකම පවසා සිටියා. එතකොට ඒ උතුම් ස්වාමීන් වහන්සේ ථුල්ලතිස්ස ස්වාමීන් වහන්සේට අවවාද කළා.

''බොහොම වැරදියි. බොහොම වැරදියි... සැබෑ පැවිද්දා කටයුතු කළ යුත්තේ ඔය විදිහට නොවෙයි. ගරු කළ යුත්තන්ට ගරු කරන්න ඕන. පිදිය යුත්තන් පුදන්න ඕන. ආගන්තුක උපස්ථාන කරන්න ඕන. නිහතමානී වෙන්න ඕන. එහෙම නැතුව කොහොමද පැවිදි ජීවිතයක් ශ්‍රේෂ්ඨ වෙන්නේ?''

මේ අවවාදයට ථුල්ලතිස්ස ස්වාමීන් වහන්සේ කිපුණා. හයියෙන් කෑ ගැසුවා. හඬා වැලපුණා. හිසෙහි අත් ගසා ගත්තා. හඬ හඬාම බුදුරජාණන් වහන්සේ ළඟට වේගයෙන් ගියා. ගිහින් අර ස්වාමීන් වහන්සේට විරුද්ධව පැමිණිලි කළා. කරුණු කාරණා විමසා බැලූ මහා කාරුණික බුදුරජාණන් වහන්සේ අවවාද කොට වදාළා.

''පින්වත් තිස්ස, බොහොම වැරදියි. බොහොම වැරදියි. සැබෑ පැවිද්දා කටයුතු කළ යුත්තේ ඔය විදිහට නොවෙයි. ගරු කළ යුත්තන්ට ගුරු කරන්න ඕන. පිදිය යුත්තන් පුදන්න ඕන. ආගන්තුක උපස්ථාන කරන්න ඕන. නිහතමානී වෙන්න ඕනැ. එහෙම නැතුව කොහොමද පැවිදි ජීවිතයක් ශ්‍රේෂ්ඨ වෙන්නේ? දැන් ඔබ ඒ ස්වාමීන් වහන්සේගෙන් සමාව ගන්න.''

එතකොට ථුල්ලතිස්ස ස්වාමීන් වහන්සේ බුදුරජාණන් වහන්සේගේ අවවාදයටවත් අවනත වුණේ නැහැ. එයාට මහා අසාධාරණයක්

වුණා කියලයි හිතාගෙන ඉන්නේ. මේ රළුපරළු ගතිගුණ නිසාම ගුණවතුන්ගේ බසට අවනත නොවුණ නිසාම අතීත සංසාරෙදිත් මේ කෙනා මහ කරදරවලට වැටිලා තියෙන බවට බුදුරජාණන් වහන්සේ පෙන්වා වදාළා. එයට කලින් මේ ගාථා දෙකෙන් කාටත් වැදගත් වෙන ධර්මයක් ඉතා ලස්සනට වදාළා.

**අක්කොච්ජි මං අවධි මං අජිනි මං අහාසි මේ**
**යේ තං උපනය්හන්ති වේරං තේසං න සම්මති**

මොහු බැණ වැදුනා මා හට - පහරත් දුන්නා මා හට
මාව පරදවා මා සතු - දෙයත් උදුරගති කියමින්
වෛරය මතු වෙන විලසට - යළි යළි මෙය සිතනා විට
ඔවුන්ගෙ වෛරය කිසිදා - නැත සංසිඳිලා යන්නේ

**අක්කොච්ඡි මං අවධි මං අජිනි මං අහාසි මේ**
**යේ තං න උපනය්හන්ති වේරං තේසූපසම්මති**

මොහු බැණ වැදුනා මා හට - පහරත් දුන්නා මා හට
මාව පරදවා මා සතු - දෙයත් උදුරගති කියමින්
වෛරය මතු වෙන විලසට - නොසිතන විට කිසි කලක දි
ඔවුන්ගෙ පවතින වෛරය - සංසිඳෙමින් නැතිවන්නේ

එතැන සිටිය ස්වාමීන් වහන්සේලාට මේ ථුල්ලතිස්ස ස්වාමීන් වහන්සේගේ අතීත ජීවිත කථාව අසන්නට කැමත්තක් ඇතිවුණා. මහා කාරුණිකයන් වහන්සේ ඒ අතීත සිදුවීම කියා දුන්නා.

ඔන්න ඈත අතීත කාලෙක බරණැස් නුවර කාලදේවලක නමින් තවුසෙක් හිටියා. ඔහු හිමාල වනාන්තරයේ භාවනා කරන කෙනෙක්. බොහෝ කල් ගත වුණහම රසවත් ආහාරපාන ටිකක් වැළඳීමේ අදහසින් නගරයට ආවා. ඇවිදින් වළං හදන කෙනෙකුගේ ශාලාවක නතර වුණා. එදාම නාරද නමින් තවත් තවුසෙක් ඒ කුඹල්

හලේ රාත්‍රිය ගත කිරීමට පැමිණියා. කුඹල්කරුවාගෙන් නවාතැන් ගැනීමට අවසර ඉල්ලුවා. එතකොට කලින් පැමිණි තවුසාගෙන් අසා ඔහු කැමැති නම් නවතින්න කියලා කුඹල්කරු පැවසුවා. ඉතින් නාරද තවුසා තමාට කලින් පැමිණි කාලදේවලගෙන් අවසර අරගෙන ඒ ශාලාවේ නැවතුණා. සුහද කතාබහේ යෙදුණා. දෙදෙනාම නින්දට ගියා. නාරද තවුසා නිදාගනිද්දී කාලදේවල තවුසා ඒ කිට්ටුවෙන්මයි නිදාගත්තේ. නමුත් ? යාමයේ ඔහු එතැනින් නැඟිට ශාලාවේ දොරකඩ ළඟ හරහට නිදාගත්තා. මැදියම් රැයේදී නාරද තවුසාට එළියට යෑමේ ඕනකමක් ඇතිවුණා. ඉතින් ඔහු නැගිට ශාලාවෙන් පිටතට යද්දී දොර හරහට නිදා සිටි කාලදේවල තවුසාගේ හිස බැඳි ජටාව පෑගුණා. ඔහු මහ හඬින් කෑ ගැහුවා. ''ඒයි... මොකද ඔය? මොකද මගේ ජටාව පෑගුවේ?''

''අනේ පින්වත් තවුසාණෙනි, ඔබතුමා ඔතැන සැතපී ඉන්න බව මා දැනගෙන හිටියේ නෑ. මට සමාවෙන්න'' කියා එළියට ගියා. එතකොට කාලදේවල තවුසා මෙහෙම සිතුවා. ''දැන් මේ පුද්ගලයා එළියට බසිද්දී මා ගැන නොසළකා මාව පාගා ගෙන ගියා. දැන් ආපසු එද්දීත් ආයෙමත් මාව පාගාවි'' කියලා හිස තිබූ පැත්තට පා දමාගෙන පා තිබූ පැත්තට හිස දමාගෙන නිදාගත්තා. නාරද තවුසා ඇවිදින් කල්පනා කළා ''මේ පැත්තෙන් ගියොත් මෙතුමාගේ හිස ආයෙමත් පෑගෙන්න පුළුවනි. ඒ නිසා පා තිබෙන පැත්තෙන් යන්න ඕන'' කියලා ඒ පැත්තෙන් යද්දී ආයෙමත් ඔහුගේ පයට ජටාව පෑගුණා. කාලදේවල තවුසා කෝපයෙන් ගිගුම් දුන්නා.

''නුඹ හිතාමතාමයි මේ දේ කළේ. ආයෙමත් මගේ බෙල්ල පෑගුවා. දැනගනින් මා නුඹට කරන දේ''

''අනේ, පින්වත් තවුසාණෙනි, මට සමාවුව මැනැව. මා මේ ගමන සිතුවේ ඔබතුමාගේ පා ඇති තැනින් යන්නයි. නමුත් ඔබතුමා ඒ පැත්තට හිස දමා සැතපී සිටින බව මා දැනසිටියේ නැහැ. අනේ මට සමාවුව මැනැව.''

''සමාව? නුඹ දැනගනින්. නුඹ මගේ තරම නොදැනයි හිස පෑගුවේ. නුඹට හෙට හිරු දකින්න ලැබෙන්නේ නෑ. හෙට හිරු උදාවෙන විට නුඹේ හිස සත්කඩකට පැළෙනවා පැළෙනවාමයි.'' කියලා පොළොවට අත් ගහගහා ශාප කළා.

නාරද තාපසතුමා නිශ්ශබ්ද වුණා. ඇතුළට ගිහින් වාඩිවුණා. භාවනා කළා. විමසලා බැලුවා මේ නිස්කාරණේ තමන්ගේ පිටට වරද පටවලා කරපු ශාපය කවුරු කරාද යන්නේ කියලා. බලද්දී නාරද තවුසාට අවබෝධ වුණා. වැරදිකාරයා කාලදේවලමයි. ඔහුගේ නපුරුකම ම යි මේකට මුල. ඔහුගේ වෛර සිතමයි මේකට මුල. එනිසා හිරු නඟිද්දී ඔහුගේ හිසමයි සත්කඩකට පැළෙන්නේ.

නාරද තවුසාට කාලදේවල ගැන මහත් අනුකම්පාවක් ඇති වුණා. මේ පුද්ගලයා තේරුමක් නැතුව විපතට පත්වෙනවා. නපුරුකම නිසාමයි මේක වෙන්නේ. මං මොහුව බේරාගන්න ඕන කියලා පසුවදා හිරු උදාවීම ඍද්ධි බලයෙන් වැළැක්වූවා.

රජමාලිගාව මිදුලට රැස් වූ ජනකාය ඝෝෂා කරන්න ගත්තා. බරණැස් රජතුමාට කන්නලව් කළා.
''අහෝ දේවයන් වහන්ස, මොකක්ද මේ වුණේ. මේ කළුවර නැතිවෙන්නෙ නෑ. හිරු උදාවෙන්නේ නෑ. මොකක්දෝ වින්නැහියක් සිදුවෙලා තියෙනවා. අහෝ දේවයන් වහන්ස, මෙයින් අපව ගලවා ගත මැනැව.''

රජතුමා කලබල වුණා. කරුණු සොයා බැලුවා. අන්තිමේදී කුඹල් ශාලාවක හිමාල වනයෙන් ආව තවුසන් දෙදෙනෙකු සිටින බව දැනගත්තා. ඔවුන් සොයාගෙන ගියා. නාරද තවුසා කාරණය පැහැදිලි කළා.

''පින්වත් රජතුමනි, මාගේ අතින් වරදක් සිදුවුණේ නෑ. මා ශාලාවෙන් එළියට යද්දී මේ තාපසයා වැරදි තැනක සැතපී සිටි නිසා මා

නොදැනුවත්ව ඔහුගේ හිස පෑගුණා. මා සමාව ඉල්ලුවා. ආපසු එද්දී ඔහු පා දමා සිටි පැත්තෙන් මා පැමිණුනා. ඒ වතාවෙත් ඔහු හිස දමා තිබුනේ ඒ පැත්තටයි. ආයෙමත් හිස පෑගුණා. මා ඉතාම බැගෑපත්ව සමාව ඉල්ලුවා. මොහු මට සමාව දුන්නේ නැහැ. ඒ වෙනුවට මට ශාප කළා. හිරු නැඟෙද්දී මගේ හිස සත්කඩකට පැළේවා කිව්වා. නමුත් මං නිවැරදියි. හිරු නැඟුනොත් සත් කඩකට පැළෙන්නේ ඔහුගේ හිසයි. ඔහු කෙරෙහි අනුකම්පාවෙන් හිරු උදා වෙන්නට නොදී ඉන්නේ මා විසිනුයි. ඔහු මගෙන් සමාව ගත්තොත් මේ ප්‍රශ්නය සමථයකට පත්වෙනවා.''

රජතුමා කාලදේවල තවුසා ළඟට ගියා. ගිහින් ඉතා බැගෑපත් වුණා. නාරද තවුසා ළඟට ගිහින් සමාව ගන්න කියා ඉල්ලා සිටියා. මේ මෝඩ කාලදේවල, රජතුමාගේ පැමිණීම නිසා තවත් හිතට ගත්තා. තවත් ආඩම්බර වුණා. සමාව ගන්න කැමැති වුණේම නැහැ. අන්තිමේදී රජතුමාට කේන්ති ගියා. කාලදේවල බලෙන් ඇදගෙන ගිහින් නාරද තවුසාගේ දෙපා අබියස නළල තැබ්බෙව්වා. සමාව ඉල්ලෙව්වා. නාරද තවුසා සමාව දුන්නා. හිසේ ප්‍රමාණයට ලොකු මැටි ගුලියක් හිස මත තබාගෙන ගඟට බසින්න කිව්වා. හිරු උදාවෙන කොටම ඒ මැටි ගුලිය පමණක් වතුරෙන් උඩ සිටින ලෙස ගිලෙන්න කිව්වා. එතකොටම නාරද තවුසා සෘද්ධිය අත්හැරියා. හිරු උදාවුණා. කාලදේවලගේ හිස මත වතුරෙන් උඩ තිබුණු අර මැටි ගුළිය හත්කඩකට පිපිරුණා.

පින්වතුනේ, පින්වත් දරුවනේ, නපුරුකමට ලැබෙන විපාක හරි පුදුමයි. පුහු අහංකාරකමත්, ආඩම්බරකමත්, මාන්නයත් නිසා වැඩිහිටියන්ගේ අවවාද නො පිළිගන්නා අය කොතරම් ඉන්නවාද? ඔවුන් හැම තිස්සේම ජීවිතයේ අවුල් හදාගන්නවා. වෛර බැඳගන්නවා. පළිගැනීමට මාන බලනවා. පව් පුරවා ගන්නවා. ඒ නිසා වෛර නොකර සිටීම ම යි උතුම්. තමන්ට තව කෙනෙකුගෙන් සිදුවුණ අඩුපාඩු සිත සිතා නොසිටීම ම යි උතුම්. වෛරය ඇති වෙන දේ නොසිතා මෙත් පැතිරවීම ම යි උතුම්.

# දහම් කැඩපත

අඳුර විනිවිද ආලෝකය දකින්නට

ශ්‍රද්ධාවන්ත පින්වතුනි, පින්වත් දරුවනි,

අපේ ජීවිතවල සාර්ථකත්වය රඳා පවතින්නේ අපි සිතුවිලි හසුරුවන ආකාරය මතයි. යම් කෙනෙක් තමන්ගේ සිතුවිලි ධර්මානුකූලව යහපත් අයුරින් පවත්වා ගන්නට දක්ෂ වුවහොත් ඔහු මෙලොව පරලොව දෙකම ජයගන්නා වූ කෙනෙක් බවට පත්වෙනවා. සාමාන්‍යයෙන් අපේ හිත් පුරුදුවෙලා තියෙන්නේ නිතරම බාහිර දේවල් ගැනම කල්පනා කර කර ඉන්නටයි. තමා ගැන කල්පනා කරන්නට, තමාට සිදුවන්නේ කුමක්ද කියා කල්පනා කරන්නට, තමාගේ යහපත ගැන කල්පනා කරන්නට මේ හිත එතරම් කැමැත්තක් දක්වන්නේ නෑ. තමා ගැන කල්පනා කිරීමේ වටිනාකම ගැන තේරුම් ගන්න මේ සිදුවීම හොඳ උදාහරණයක්.

බරණැස් නුවර ඉසිපතන මිගදායේ දී දම්සක් පැවතුම් සූත්‍රය දේශනා කළ බුදුරජාණන් වහන්සේ, උරුවෙල ජනපදය දක්වා වැඩමකරන අතරමඟ එක්තරා වන ලැහැබක, රමණීය රුක් මුලක වැඩ සිටි සේක. ඒ අවස්ථාවේ, භද්දවග්ගිය නම් කුමාරවරු තිස් දෙනෙක් ඔවුන්ගේ බිසෝවරු ද සමඟ විනෝද වෙමින් වන ලැහැබේ ඔබමොබ හැසිරෙන්නට වුණා. ඒ කුමාරුවරුන්ගෙන් එක්කෙනෙකුට බිරිඳක් සිටියේ නැහැ. ඒ නිසා මිතුරන් සමග එකට විනෝද වීම පිණිස තරුණ වෙසඟනක් කැඳවාගෙන ආවා. සියලුදෙනා එකසේ විනෝද වෙනු දුටු එම තැනැත්තිය ඔවුන්ගේ ප්‍රමාදයක් දැක කුමාරවරු සතු වටිනා කියන බඩුබාහිරාදිය රැගෙන පලා ගියා.

## වෙසඟනක් ලුහුබැඳි කුමාරවරු...

භද්දවග්ගිය කුමාරවරු තම යහළුවාගේ ආගන්තුක බිරිඳ නිසා ඇතිවූ මෙම විනාශය ගැන කලකිරී ඇය සොයමින් වනය පුරා සැරිසරන්නට වුණා. මෙසේ එහෙමෙහෙ ඇවිදින පිරිසට ගසක් මුල නිසොල්මනේ වැඩ සිටි බුදුරජාණන් වහන්සේ දකින්නට ලැබුණා. තම බඩුමුට්ටු රැගෙන රහසේ පලා ගිය සෙර, මේ හුදකලාව වෙසෙන ශ්‍රමණයන් වහන්සේ විසින් දකින්නට ඇතැයි ඔවුන් කල්පනා කළා. ඒ අනුව බුදුරජාණන් වහන්සේ අසලට පැමිණි එම තරුණ පිරිස "ස්වාමීනි, අපේ යහළුවකුගේ බඩුමුට්ටු නැති වුණා. එය

සොරාගනු ලැබුවේ අප සමගම පැමිණි අඟනකැයි අප සැක කරනවා. ඔබ වහන්සේ වැඩ ඉන්න විට මේ අසලින් ගිය කාන්තාවක් දුටුවාදැ''යි විමසා සිටියා.

මේ අසලින් ගිය ගැහැනියක දුටුවාදැයි යනුවෙන් තමන් වහන්සේගෙන් විමසනු ලැබූ ප්‍රශ්නයට භාග්‍යවතුන් වහන්සේ පිළිතුරු නොදුන් සේක. ඔවුන්ගෙන්ම පෙරලා මෙසේ ප්‍රශ්න කළ සේක. තමන් ළඟ සිට නැති වූ කෙනෙකු සොයා වෙහෙසීම කළ යුතු නමුත්, වඩාත් උතුම් වන්නේ අනුන් ගැන සෙවීමද? නොඑසේනම් තමන් ගැන සෙවීමදැයි භාග්‍යවතුන් වහන්සේ ඔවුන්ගෙන් විමසූ සේක. බුදුරජාණන් වහන්සේ විමසූ පැනයෙන් ඔවුන් සියලු දෙනාගේ කැළඹී ගොස් තිබූ සිත් සංසිඳී ගියා. ධර්මාවබෝධයට පින් ඇති භද්දවග්ගිය කුමාරවරු සියලු දෙනාම පිළිතුරු දුන්නේ තමන් ගැන සෙවීම උතුම් කියා ය. මෙසේ හටගත් සංවාදය වඩාත් ගැඹුරට පැමිණීමෙහි ප්‍රතිඵලයක් ලෙස, රජඇඳුමින් සැරසී මහවනය මැද අඟනක සොයමින් සිටි ඒ කුමාරවරු උතුම් වූ සෝවාන් ඵලය සාක්ෂාත් කළා. ගෞතම බුදු සසුනේ පැවිදි බව ලද මේ භද්දවග්ගිය කුමාරවරු උතුම් අර්හත්වය ද සාක්ෂාත් කළා.

## තමන් ගැන සොයමු...

එනිසා පින්වත් දරුවනි, අනුන් ගැන සොයනවාටත් වඩා, වෙනත් බාහිර දේවල් කල්පනා කරනවාටත් වඩා මේ ලෝකයේ උතුම් වන්නේ තමන් ගැන සෙවීමයි. තමන් ගැන කල්පනා කිරීමයි. ඒ නිසා ඔබ අප සියලු දෙනා ලද මේ අතිදුර්ලභ අවස්ථාවෙන් ප්‍රයෝජන ගන්නට නම්, අන් අයගේ වැරදි අඩුපාඩු ගැන සෙවීම අත්හැර දමා, අප කවුරුත් සරණ ගිය ශාස්තෲන් වහන්සේ වූ භාග්‍යවත් ගෞතම සම්මා සම්බුදුරජාණන් වහන්සේ දේශනා කොට වදාළ ධර්මය අනුව තමා ගැන කල්පනා කිරීමට උත්සහ කළ යුතුය. ඒ අනුව, තමා තුළින් ලෝකයේ යථාර්ථය දැකීමත් තමාව නිවැරදිව හඳුනා ගැනීමත් තමා තුළින්ම පිහිට පිළිසරණ සලසා ගන්නා ආකාරයත් ගැන ඒ උතුම් සද්ධර්මය ඇසුරින් ම විමසා බලමු.

කැඩපතක් ඉදිරියට ගිය විට අපට දර්ශනය වන්නේ අපේ ම ඡායාවයි. එයින් අපට පුළුවන් අපේ ඇඳුම්වල අඩුපාඩු, මුහුණේ, කොණ්ඩේ අඩුපාඩු සකස් කරගන්න. කොටින්ම ප්‍රසන්න වූ පෙනුමක් සකස් කරගන්න කැඩපත බොහෝ උපකාර වෙනවා.

ඒත් සිත අභ්‍යන්තරයේ පවතින අඩුපාඩු සකස් කරගන්න මේ භෞතික කැඩපතින් බැහැ. අටලෝ දහමට අනුව දේලනය වන ජීවිතය කෙළවරක් නැති සංසාර ගමනෙන් එතෙර කරවා අමා මහ නිවනින් නිවා සනසාලනු ලබන්නේ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ දේශනා කොට වදාළ ශ්‍රී සද්ධර්මය පමණයි. අපි අපටම, අපේ ජීවිත දෙස බලා, සිත අභ්‍යන්තරය පිරිසිදු කරගන්නට භාග්‍යවතුන් වහන්සේ වදළ ඒ ධර්මය තුළ ඇති සදහම් කැඩපත නම් වූ දහම් පර්යාය උපයෝගී  කරගත හැකිය. එනිසා, ඒ සදහම් කැඩපත උපයෝගී කරගෙන අප තුළ පවතින අකුසල් බැහැර කරලා කුසලය උපදවාගෙන සසරින් නිදහස් වීමේ දුර්ලභ වාසනාව අපිත් උදාකර ගනිමු.

## දහම් කැඩපත



දිනක් ආනන්ද ස්වාමීන් වහන්සේ බුදුරජාණන් වහන්සේ කරා එළැඹ මෙසේ විමසීය.

"ස්වාමීනී භාග්‍යවතුන් වහන්ස; නාදීකා ග්‍රාමයේ විසූ සාල්හ නම් භික්ෂුව කලුරිය කළේය. ඔහු උපන්නේ කොහේද? පරලොව පැවැත්ම කුමන ස්වභාවයකින් යුක්තද?

නන්ද නම් මෙහෙණින් වහන්සේ කලුරිය කළාය. ඇයගේ මතු ගතිය කුමක්ද? පරලොව කුමන ස්වභාවයකින් යුක්තද?

සුදත්ත නම් උපාසක තෙමේ කලුරිය කළේය... සුජාතා නම් උපාසිකාව

කලුරිය කළාය... කකුධ නම් උපාසක ද... කාලිංග නම් උපාසක ද... නිකට නම් උපාසක ද... කටිස්භ නම් උපාසක ද... තුට්ඨ නම් උපාසක ද... සන්තුට්ඨ නම් උපාසක ද... භද්‍ර නම් උපාසක ද..... සුභද්‍ර උපාසක ද කලුරිය කළේය. ඔවුන් උපන්නේ කොහේද? පරලොව කුමන ස්වභාවයකින් යුක්ත ද?

"ආනන්දයනි, සාල්හ නම් භික්ෂුව ආශ්‍රව ක්‍ෂය කිරීමෙන් අරහත්වයට පත්වී කලුරිය කළේය. නන්දා නම් මෙහෙණිය ඕරම්භාගීය සංයෝජන ක්‍ෂය කිරීමෙන් ඕපපාතිකව සුද්ධාවාස බ්‍රහ්ම ලෝකයේ උපත ලැබුවාය. සුදත්ත උපාසක සංයෝජන තුනක් ක්‍ෂය කිරීමෙන් රාග, ද්වේෂ මෝහ තුනී වූ බැවින් සකදාගාමී වූයේය. එක් වරක් මේ ලෝකයට පැමිණ දුක් කෙළවර කරන්නේය. පින්වත් ආනන්දයෙනි, සුජාතා උපාසිකාව සංයෝජන තුනක් ක්‍ෂය කිරීමෙන් සෝවාන් වූවාය. ඇය සතර අපා දුකට නැවත නොවැටෙන්නීය. නියත වශයෙන් නිර්වාණය සාක්ෂාත් කරන්නීය.

පින්වත් ආනන්දයෙනි, කකුධ නම් උපාසක තෙමේ ඕරම්භාගිය සංයෝජන පහක් ක්‍ෂය කිරීමෙන් සුද්ධාවාසයේ උපත ලැබුවේය. එහි දී ම පිරිනිවීම සිදු වන්නේ ය. පින්වත් ආනන්දය, කාලිංග උපාසක... නිකට උපාසක... කටිස්භ උපාසක... තුට්ඨ උපාසක... සන්තුට්ඨ උපාසක... භද්‍ර උපාසක... සුභද්‍ර උපාසක ඕරම්භාගිය සංයෝජන පහක් ක්‍ෂය කිරීමෙන් සුද්ධාවාසයේ උපත ලැබුවේය. ඔවුන් පිරිනිවන් පාන්නේ බඹලොව දී ය.

පින්වත් ආනන්ද, නාදිකා ග්‍රාමයේ වැසියෝ පනහකට වැඩි පිරිසක් කලුරිය කිරීමෙන්  පසු සුද්ධාවාස බඹලොව ඉපදුනහ. ඔවුහූ සියලු දෙනාම බඹලොව දී පිරිනිවන් පාන්නෝය. නැවත මෙලොවට නොපැමිණෙති. නාදිකා ග්‍රාමයේ අනූවකට වැඩි දෙනෙක් සංයෝජන ධර්ම තුනක් ක්‍ෂය කිරීමෙන් ද රාග, ද්වේෂ, මෝහ තුනී කිරීමෙන් ද සකදාගාමී වූහ. ඔවුහු එක්වරක් පමණක් මෙලොවට පැමිණ දුක් කෙළවර කරති.

පින්වත් ආනන්දයෙනි, පන්සියයකට වැඩි දෙනෙකු කලුරිය කළේ සංයෝජන තුනක් ක්‍ෂය කිරීමෙන් සෝවාන් ඵලයට පත්වීමෙනුයි. එනිසා ඔවුහු කිසි දිනෙක අපා දුකට නොවැටෙති. නියත වශයෙන් අරහත් බව සාක්ෂාත් කරති.''

නාදිකා ග්‍රාමයේ මිනිසුන් උපන් ස්ථාන පිළිබඳව ආනන්ද ස්වාමීන් වහන්සේ විමසූ විට, බුදුරජාණන් වහන්සේ ඒ ආකාරයට වදාළ සේක.


# මරණින් මතු අපි කොයිබටද?



ඉන්පසු භාග්‍යවතුන් වහන්සේ, මරණින් මතු තමන් උපදින්නේ කොහේද යන්න ප්‍රත්‍යක්ෂ කොට තමාටම දැනගත හැකි සදහම් කැඩපත නම් වූ මේ ධර්ම පරියාය දේශනා කොට වදාළ සේක.

''ආනන්දයෙනි, මනුෂ්‍යව උපන්නෙක් කලුරිය කරන්නේ ය යන යමක් ඇද්ද, මෙය ආශ්චර්යයක් නොවෙයි. ඉදින් ඒ ඒ මිනිසා කලුරිය කළ කල්හී තථාගතයන් වෙත එළැඹ එහි අරුත් විමසන්නහු නම්, ආනන්දයෙනි, එය තථාගතයන් හට වෙහෙසක් ම ය. එහෙයින් ආනන්දයෙනි, යම් ධර්මයකින් යුක්ත වූ ආර්ය ශ්‍රාවකයා කැමති නම් 'නිරයෙහි උපත ක්ෂය කළ කෙනෙක්මි. තිරිසන් ලොව උපත ක්ෂය කළ කෙනෙක්මි. ප්‍රේත ලොව උපත ක්ෂය කළ කෙනෙක්මි. අපාය දුගතියෙහි උපත ක්ෂය කළ කෙනෙක්මි. සෝවාන් වූවෙක්මි. අපායට නොවැටෙනසුලු වෙමි. නියතයෙන් ම නිවන පිහිට කොට ඇත්තෙමි' යි තමා ම තමා ගැන කියයි ද, එබඳු වූ 'දහම් කැඩපත' නැමැති ධර්ම ක්‍රමයක් දේශනා කරන්නෙමි.'' මෙසේ තථාගතයන් වහන්සේ 'දහම් කැඩපත' නම් වූ දහම් පර්යාය දේශනා කරමින් ආර්ය ශ්‍රාවකයා විසින් තමා තුළ ප්‍රගුණ කළ යුතු උතුම් ගුණ ධර්ම සතරක් පිළිබඳව වදාළ සේක.

## 01. බුද්ධරත්නය කෙරෙහි පිහිටි නොසෙල්වෙන පැහැදීම



මෙහිලා ආර්ය ශ්‍රාවකයා භාග්‍යවතුන් වහන්සේ අරබයා මෙබඳු නොසෙල්වෙන පැහැදීමකින් යුතු වන්නේය.

"භාග්‍යවතුන් වහන්සේ රාග, ද්වේෂ, මෝහ සහමුලින්ම දුරු කළ නිසා 'අරහං' වන සේක. ගුරූපදේශ නොමැතිවම චතුරාර්ය සත්‍යය ධර්මය පරිපූර්ණ

වශයෙන් අවබෝධ කළ නිසා 'සම්මා සම්බුද්ධ' වන සේක. උතුම් වූ විද්‍යාවන්ගෙන් ද චරණ ධර්මයන්ගෙන් ද යුතු නිසා 'විජ්ජාචරණ සම්පන්න' වන සේක. සුන්දර වූ නිවන් මඟ අවබෝධ කොට අමා මහා නිවනට වැඩම කොට වදාළ නිසා සුගත වන සේක. ආධ්‍යාත්මික, බාහිර සියලු ලෝක පරිපූර්ණ වශයෙන් අවබෝධ කොට ඒ සියලු ලෝකවලින් නිදහස් වී වදාළ නිසා 'ලෝකවිදූ' වන සේක. අකීකරු දෙව් මිනිසුන් දමනය කොට අමා නිවනට පමුණුවා වදාළ නිසා 'අනුත්තරෝ පුරිසදම්ම සාරථී' වන සේක. සියලු දෙවිවරුන්ගේ ද සියලු මිනිසුන්ගේ ද එකම ශාස්තෘන් වහන්සේ වන නිසා 'සත්ථා දේව මනුස්සානං' වන සේක. තමන් වහන්සේ විසින් අවබෝධ කොට ගත් ධර්මය අන් අයට ද අවබෝධ කර ගැනීම පිණිස මහා කරුණාවෙන් යුතුවම දේශනා කොට වදාළ නිසා 'බුද්ධ' වන සේක. මේ සියලු සම්බුදු ගුණයන් දරා වැඩ සිටීමට තරම් භාග්‍යවන්ත නිසා 'භගවා' වන සේක.'' යනුවෙන් බුදුරජාණන් වහන්සේ අවබෝධයෙන් සරණ යන්නේ වෙයි.

## 02. ධර්මරත්නය කෙරෙහි පිහිටි නොසෙල්වෙන පැහැදීම



''බුදුරජාණන් වහන්සේ විසින් මේ ශ්‍රී සද්ධර්මය මනාකොට දේශනා කරන ලද නිසා 'ස්වාක්ඛාත' වන සේක. තමා විසින් ම දැක ගත යුතු නිසා 'සන්දිට්ඨික'වන සේක. මේ ජීවිතයේ දී ම අවබෝධ කළ හැකි නිසා 'අකාලික' වන සේක. එන්න, ඇවිත් බලන්න යැයි කීමට සුදුසු වූ නිසා 'ඒහිපස්සික' වන සේක. තමා තුළට පමුණුවා ගත යුතු වූ නිසා 'ඕපනයික' වන සේක. තම තම නැණ පමණින් අවබෝධ කළ හැකි වූ නිසා 'පච්චත්තං වේදිතබ්බෝ විඤ්ඤූහි' වන සේක" යනාදී වශයෙන් මේ ශ්‍රී සද්ධර්ම රත්නය කෙරෙහි අවබෝධයෙන් යුතු නොසෙල්වෙන පැහැදීමකින් යුක්ත වේ.

## 03. සංඝරත්නය කෙරෙහි පිහිටි නොසෙල්වෙන පැහැදීම



ඒ ආර්ය ශ්‍රාවකයා, ශ්‍රාවක මහා සංඝරත්නය ගැන මෙසේ නොසෙල්වෙන පැහැදීමෙන් යුතු වූයේ වෙයි. ඒ භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක මහා සංඝරත්නය ''රාග, ද්වේෂ, මෝහ දුරු කිරීම පිණිස සීල, සමාධි, ප්‍රඥා ත්‍රිවිධ ශික්‍ෂාවේ හික්මෙන වැඩ පිළිවෙළට පිළිපන් නිසා 'සුපටිපන්න' වන සේක. ඍජු මාර්ගය වූ ආර්යාෂ්ටාංගික මාර්ගයේ ගමන් කරනා හෙයින් 'උජුපටිපන්න' වන සේක. චතුරාර්ය සත්‍ය ධර්මය අවබෝධ කරගැනීමට පිළිපන් හෙයින් 'ඤායපටිපන්න' වන සේක. මේ ශ්‍රී සද්ධර්මය මහත් වූ ගෞරවයකින් ලොව පුරා පතුරුවාලන හෙයින් 'සාමීචිපටිපන්න' වන සේක.

සෝවාන් මඟට පිළිපන්, සෝවාන් ඵල ලාභී, සකදාගාමී මඟට පිළිපන්, සකදාගාමී ඵල ලාභී, අනාගාමී මඟට පිළිපන්, අනාගාමී ඵල ලාභී, අරහත් මාර්ගයට පිළිපන්, අරහත් ඵල ලාභී යනුවෙන් පුද්ගල වශයෙන් ගත්කල අට දෙනෙකුගෙන් ද යුගළ වශයෙන් ගත්කල සතර දෙනෙකුගෙන් ද සමන්විත වූ ඒ ශ්‍රාවක සංඝරත්නය,

චීවර, පිණ්ඩපාත, සේනාසන, ගිලන්පස ආදිය පිළියෙල කොට පිළිගැන්වීමට සුදුසු හෙයින් 'ආහුනෙය්‍ය' වන සේක. ආගන්තුක ලෙස වැඩම කළ කල්හි සිවුපසයෙන් උපස්ථාන කිරීමට සුදුසු වන හෙයින් 'පාහුනෙය්‍ය' වන සේක. මෙලොව පරලොව පින් සළකාගෙන සිවුපසයෙන් පූජා ලැබීමට සුදුසු වන හෙයින් 'දක්ඛිණෙය්‍ය' වන සේක. දෙව්මිනිස් ලෝකයාගේ වන්දනමානනවලට සුදුසු වන හෙයින් 'අංජලිකරණීය' වන සේක" යනුවෙනි.

මෙසේ සියලු දෙව්මිනිසුන්ගේ අනුත්තර පින්කෙත වූ ආර්ය මහා සංඝරත්නය කෙරෙහි මේ ආර්ය ශ්‍රාවකයා අවබෝධයෙන් යුතු පැහැදීමෙන් යුක්ත වන්නේය.

## 04. ආර්ය කාන්ත සීලය

එමෙන්ම තථාගත ශ්‍රාවකයා කඩ නොවූ, සිදුරු නොවූ, කැළැල් රහිත වූ, තෘෂ්ණා දාසත්වයෙන් මිදුණු, නුවණැත්තන් විසින් ප්‍රශංසා කරන, මාර්ගඵල සමාපත්තිය පිණිස පවතින්නා වූ ආර්යන් වහන්සේලාට ප්‍රිය මනාප සීලයෙන් සමන්විත වේ.

මේ අයුරින් තථාගත ශ්‍රී සද්ධර්මය තුළින් තමා දෙස බලන ශ්‍රාවකයා හට භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි නොසෙල්වෙන පැහැදීමත්, ධර්මරත්නය කෙරෙහි නොසෙල්වෙන පැහැදීමත්, සංඝරත්නය කෙරෙහි නොසෙල්වෙන පැහැදීමත්, ආර්යකාන්ත සීලයත් තමා තුළින් දැකිය හැකි නම් ඔහු හට තමා පිළිබඳ මෙසේ ගත හැක්කේය.

**"ආනන්දයෙනි, යම් ධර්මයකින් යුක්ත වූ ආර්ය ශ්‍රාවකයා කැමති නම් නිරයෙහි උපත ක්ෂය කළ කෙනෙක්මි. තිරිසන් ලොව උපත ක්ෂය කළ කෙනෙක්මි. ප්‍රේත ලොව උපත ක්ෂය කළ කෙනෙක්මි. අපාය දුගතියෙහි උපත ක්ෂය කළ කෙනෙක්මි. සෝවාන් වූවෙක්මි. අපායට නොවැටෙන සුලු වෙමි. නියතයෙන් ම නිවන පිහිට කොට ඇත්තෙමි' යි තමාම තමා ගැන කියයි ද එබඳු වූ 'දහම් කැඩපත' නමැති ධර්ම ක්‍රමය මෙයයි."**

**(මහා පරිනිබ්බාන සූත්‍රය - දීඝ නිකාය 02)**

පින්වත් දරුවනේ, තුන්ලෝකයේ අපට ඇති එකම පිළිසරණ මේ තිසරණය යි. ගිහියෙක් හෝ වේවා පැවිද්දෙක් හෝ වේවා, යමෙක් තිසරණ සරණ යන්නේ නම් එය අවබෝධයෙන් කළ යුතු වේ. එය තමන්ගේ ජීවිතයේ ලබන උත්තරීතර ආශීර්වාදය යි.

## තිසරණයේ පිහිටීම මහත් ම ලාභය යි



**යම් කෙනෙකුට මේ උතුම් තිසරණයෙහි මනාව පිහිටා සිටින්නට ලැබුණහොත් එය වනාහී ඔහු ලබන මහත් ලාභය යි.**

"පින්වත් ආනන්ද, යම් කෙනෙකු කෙරෙහි අනුකම්පා කරන්නේ නම්, ඒ යමෙක් ඔබගේ සුහද මිත්‍රයෝ හෝ වෙත් නම්, ඤාති හිතෛෂීහු වෙත් නම් ඔවුහු (ඔබ පවසන දෙය) ඇසිය යුතු යැයි සිතත් ද, පින්වත් ආනන්ද, ඔබ විසින් ඔවුන් ව කරුණු තුනක් තුළ සමාදන් කරවිය යුතු ය. ඇතුළත් විය යුතු ය. පිහිටුවිය යුතු ය.

කවර කරුණක් ද යත්, බුදුරජුන් කෙරෙහි නොසෙල්වෙන ප්‍රසාදය ඇති කරගැනීමෙහි සමාදන් කරවිය යුතු ය. ඇතුළත් කරවිය යුතු ය. පිහිටුවිය යුතු ය.

සද්ධර්මය කෙරෙහි නොසෙල්වෙන ප්‍රසාදය ඇති කරගැනීමෙහි සමාදන් කරවිය යුතු ය. ඇතුළත් කරවිය යුතු ය. පිහිටුවිය යුතු ය.

ශ්‍රාවක සඟ පිරිස කෙරෙහිත් නොසෙලවෙන ප්‍රසාදය ඇති කරගැනීමෙහි සමාදන් කරවිය යුතු ය. ඇතුළත් කරවිය යුතු ය. පිහිටුවිය යුතු ය.

පින්වත් ආනන්දය, මේ පඨවි, ආපෝ, තේජෝ, වායෝ යන සතර මහා ධාතූන් වනාහී වෙනස් ස්වභාවයකට පත් වන්නේ ම ය. එහෙත් බුදුරජුන් කෙරෙහි, සද්ධර්මය කෙරෙහි, ශ්‍රාවක සඟ පිරිස කෙරෙහි නොසෙල්වෙන ප්‍රසාදයෙන් යුතු තැනැත්තාගේ පැහැදීම එසේ වෙනස් ස්වභාවයට පත් නොවේ. වෙනස් ස්වභාවයට පත්වීම යනු මෙයයි. එනම්,

"පින්වත් ආනන්දය, බුදුරජුන් කෙරෙහි, සද්ධර්මය කෙරෙහි, ශ්‍රාවක සඟ පිරිස කෙරෙහි නොසෙල්වෙන පැහැදීම ඇති ඒ ආර්ය ශ්‍රාවකයා කිසිසේත් ම නිරයේ හෝ තිරිසන් ලෝකයෙහි හෝ ප්‍රේත ලෝකයෙහි හෝ උපත ලබන්නේ ය යන කරුණ සිදු නොවන්නේ ම ය."

(අංගුත්තර නිකාය තික නිපාතය)

සම්බුදු මුවින් ම වදාරණ ලද මේ උතුම් දෙසුම ගැන සිත යොමු කොට, අපි කවුරුත් වහා වහා තිසරණයෙහි ම මනාකොට පිහිටිය යුතු ය. තිසරණයෙහි ම ගුණ සිහි කළ යුතුය. තිසරණය නම් වූ මහානීය ධනයෙන් ධනවත් වන තැනැත්තා සිතින් දිළින්දෙක් නොවේ. එම නිසා තිසරණයෙහි ශ්‍රද්ධාව පිහිටුවා ගෙන අනන්ත සැප උදා කර දෙන ශ්‍රද්ධා ධනය ලබා ගනිමු.

## රැකිය යුතු සීලය මෙය යි



තිසරණගත වූ ශ්‍රාවකයෝ වනාහී, ඉතා යහපත් වූ දැහැමි ජීවිකාවකට කැමැත්තෝ ය. ඔවුහු නිති පන්සිල් සුරකිති. තමන්ගේ කායික ක්‍රියාවකින් හෝ වාචසික ක්‍රියාවකින්, තමන්ට හෝ අන්‍යයන්ට හෝ වරදක් සිදු කිරීමට අකැමැති ඔවුහු, ඉතා කැමැත්තෙන් ම සිල්වත් වෙති.

"සිල්වත් වීම" යනු බිම බලාගෙන යාම හෝ කා සමඟවත් කතා නොකර සිටීම හෝ නොවේ. එමෙන්ම, හෙමින් හෙමින් ගමන් කිරීම ද නොවේ .

"සිල්වත් වීම" යනු කායික හා වාචසිකව සිදුවන වරදින් මිදීම ම යි. එය සිතා මතා යළි යළිත් සකස් කර ගතයුතු දෙයකි. මනා සිහි කල්පනාවෙන් පුරුදු කළ යුතු දෙයකි. ඇතැම්හු කායික වරදින් මිදී සිටිති. එහෙත් බොරු කීම්, කේලාම් කීම් ආදියෙන් වරදේ බැඳෙත්. එම නිසා තමන්ගෙන් සමාජයට සිදුවන්නට තිබෙන හානිවලින් තමාව වළක්වා ගැනීමයි සීලයෙන් සිදුවන්නේ. එහෙයින් අප සියලු දෙනාම සිල්වත් වීමට පුරුදුවිය යුතු ම ය.

## ශික්ෂා පද

ශික්ෂා පද සමාදන් වීමෙන් තමන්ගේ ජීවිතයේ පාලනයක් හෙවත් සීමාවක් ඇති කරගත හැකිවේ. ශික්ෂාව යනු වරදින් මිදීමේ පහසුම මඟයි. ශික්ෂා පද රැකගැනීමට කල්පනා කරන තැනැත්තා ධාර්මික සතුටක් උපදවා ගැනීමට සමර්ථ වෙයි.

## සිල් රැකීමේ අනුසස්



අපගේ ස්වාමී වූ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ පාටලී නම් ගමක භික්ෂු සංඝයා පිරිවරා වැඩම කළ සේක. ඒ පාටලී ගම්වැසි සැදැහැවතුන් විසින් තනවන ලද විශ්‍රාම ශාලාව විවෘත කිරීම සිදු කරනු ලැබුවේ භාග්‍යවතුන් වහන්සේ ප්‍රමුඛ භික්ෂු සංඝයාට එම ශාලාව පරිභෝග කිරීමට සැලැස්වීමෙනි. එහි දී භාග්‍යවතුන් වහන්සේ සීලවන්තයාට උදා කර ගත හැකි සම්පත් පහක් වදාළ සේක.

01. සිල්වත් තැනැත්තා ප්‍රාණඝාතයෙන් වැළකී, සොරකමින් වැළකී, වැරදි කාමසේවනයෙන් වැළකී, බොරු කීමෙන් වැළකී, මත්පැන් මත්ද්‍රව්‍ය භාවිතයෙන් වැළකී ජීවිතය ගෙවන නිසා ඔහු අප්‍රමාදී ව උත්සාහයෙන් කටයුතු කරයි. ඒ නිසා ම, ඔහු මහත් වූ සැප සම්පත් ලබයි. මෙය සීල සම්පත්තියේ පළමු ආනිශංසය යි.

02. සිල්වත් තැනැත්තාගේ යහපත් ජීවිතය ගැන කල්‍යාණ කීර්ති රාවයක් උස්ව පැන නඟින්නේ වෙයි. මෙය සීල සම්පත්තියේ දෙවන ආනිශංසය යි.

03. සිල්වත් තැනැත්තා රජ, ඇමති, සිටු ආදී කවර හෝ ප්‍රභූන් පිරිසක් මැදකට ගියද විශාරදව යයි. තේජස් සහිතව යයි. මෙය සිල්වතාගේ සීල සම්පත්තියේ තෙවන ආනිශංසය යි.

04. සිල්වත් තැනැත්තා සිහි විකල් නොවී කළුරිය කරයි. මෙය ඔහුගේ සීල සම්පත්තියේ සිවුවන ආනිශංසය යි.

05. සිල්වත් තැනැත්තා මරණයෙන් පසු ඉතා යහපත් ස්වභාව ඇති සුගති ලොවක උපදී. සීල සම්පත්තියේ පස්වන ආනිශංසය මෙයයි.

(මහා පරිනිබ්බාන සූත්‍රය - දීඝ නිකාය 02)

## සීලය බිඳෙන හැටි හඳුනා ගනිමු.



වර්තමාන සමාජයේ සීලය සහ සිල්පද බිඳෙන ආකාරය නොයෙකුත් මත ඔස්සේ අර්ථ නිරූපණය කිරීමේ ප්‍රවණතාවක් දක්නට ලැබේ. නමුත් බුදුරජාණන් වහන්සේ සීලය බිඳෙන ආකාරය පෙන්වා දී ඇත්තේ මේ ආකාරයට යි. ඒ අනුව සීලය නිරවුල් ව දැනගැනීමෙන් නිවැරදි වූ ප්‍රතිපදාවක් තුළ හික්මීමට අපට භාග්‍යය උදාවනු ඇත.



## 01. ප්‍රාණඝාතයෙන් වැළකීමේ ශික්ෂා පදය

"ඔහු හෝ ඇය සතුන් මැරීමෙන් වැළකිලා ඉන්නවා. දඬුමුගුරු අත්හැර දාලා, අවි ආයුධ බැහැර කරලා පවට ලැජ්ජා ඇතුව ඉන්නවා. සතුන් කෙරෙහි දයාව දක්වනවා. සියලු ප්‍රාණීන් කෙරෙහි හිතානුකම්පීව වාසය කරනවා."

(සාමඤ්ඤඵල සූත්‍රය - දීඝ නිකාය 01)

### ප්‍රාණඝාතය සිදු වන ආකාරය

"මහණෙනි, මෙහිලා ඇතැමෙක් සතුන් මරන්නේ වෙයි. හේ රෞද්‍ර ය, ලේ වැකුණු අත් ඇත්තේය. වැනසීම්, පැහැර ගැනීම්වලින් යුක්ත වූයේ ය. සියලු ප්‍රාණභූතයන් කෙරෙහි දයා නැත්තේ ය."

**මෙම ශික්ෂා පදය බිඳෙන්නේ පහත අංග සම්පූර්ණ වීමෙනි.**

- පණ ඇති සතෙකු වීම.
- පණ ඇති සතෙකු බව දැනගැනීම.
- මරණ චේතනාව ඇති වීම.
- මැරීමට උපක්‍රමයක් කිරීම.
- උපක්‍රමයෙන් මරණයට පත් කිරීම.

## 02. සොරකමින් වැළකීමේ ශික්ෂා පදය



"ඔහු හෝ ඇය නොදුන් දෑ ගැනීම අතහැරලා, නොදුන් දේ ගැනීමෙන් වැළකිලා ඉන්නවා. දුන් දේ පමණක් පිළිගන්නවා. දුන් දේ පමණක් පිළිගනු කැමති වෙනවා. සොර රහිත සිතින් යුතු වූ, පිරිසිදු සිතින් යුතු වූ ජීවිතයකින් වාසය කරනවා."

(සාමඤ්ඤඵල සූත්‍රය - දීඝ නිකාය 01)

**සොරකමක් සිදුවන ආකාරය.**

"මෙහිලා ඇතැමෙක්, සොරකම් කරන්නේ වෙයි. ගමෙහි වේවා, වනයෙහි වේවා, අන් අය සතු වස්තු උපකරණ ආදියක් ඇත්ද, ඒ නුදුන් දේ සොර සිතින් පැහැර ගන්නේ වෙයි."

**මෙම ශික්ෂා පදය බිඳෙන්නේ පහත අංග සම්පූර්ණ වීමෙනි.**

- අන්සතු වස්තුවක් වීම.
- අන්සතු වස්තුවක් බව දැනගැනීම.
- සොර සිත (ථෙය්‍යචිත්තෝ)
- ගැනීමට උපක්‍රමයක් කිරීම.
- එම උපක්‍රමයෙන් ගැනීම.

## 03. වැරදි කාම සේවනයෙන් වැළකීමේ ශික්ෂා පදය



මෙහිලා ඇතැමෙක් වැරදි කාම සේවනයෙන් යුතු වූයේ වෙයි. "එනම් මව විසින් රකිනු ලබන, පියා විසින් රකිනු ලබන, මාපියන් විසින් රකිනු ලබන, සොයුරා විසින් රකිනු ලබන, සොයුරිය විසින් රකිනු ලබන, නෑයා විසින් රකිනු ලබන, ගුණධර්ම විසින් රකිනු ලබන, යම් ස්ත්‍රීහු සිටිත් ද, එමෙන්ම ස්වාමියා සහිත වූ, විවාහය පිණිස යටත් පිරිසයෙන් මල් මාලයකින් හෝ අවුරණ ලද ස්ත්‍රීහු වෙත් ද, එබඳු වූ ස්ත්‍රීන් කෙරෙහි වරදෙහි නො බැඳෙන්නේ වෙයි."

ඉහත සඳහන් වූ ආකාරයට තම බිරිඳ ඉක්මවීම වැරදි කාම සේවනය යි. බිරිඳක් නම් තම සැමියා ඉක්මවීම ද වැරදි කාම සේවනයකි.

## 04. බොරු කීමෙන් වැළකීමේ ශික්ෂා පදය



" බොරු කීම අතහැරලා බොරු කීමෙන් වැළකී වාසය කරනවා. සත්‍යය කථා කරනවා. ඇත්තෙන් ඇත්ත ගළපනවා. ස්ථිරව පිහිටා කතා කරනවා. පිළිගත හැකි දේ කතා කරනවා. ලෝකයාව රවට්ටන්නේ නැහැ."

(සාමඤ්ඤඵල සූත්‍රය - දීඝ නිකාය 01)

**බොරුවක් සිදුවන ආකාරය**

"සභාවකට ගියේ වේවා, පිරිසක් මැදට ගියේ වේවා, නෑයන් මැදට ගියේ වේවා, ජන සමූහයක් මැදට ගියේ වේවා, රජය මැදට ගියේ වේවා, ඔහු ඉදිරියට කැඳවා සාක්ෂි විමසන්නේ නම්, 'එම්බා පුරුෂය, මෙහි එව. යමක් දන්නෙහි නම් එය පවසවු. එවිට හේ නොදන්නේ ම 'දනිමි' යි කියන්නේ ය. දන්නේ ම 'නොදනිමි' යි කියන්නේ ය. නුදුටුවේ ම 'දකිමි' කියන්නේ ය. දුටුවේ ම 'නොදකිමි' යි කියන්නේ ය. මෙසේ තමා උදෙසා හෝ අනුන් උදෙසා හෝ කිසියම් ලාභයක් උදෙසා හෝ දැන දැන බොරු කියන්නේ වෙයි.''

**අට ආකාර වූ අනාර්ය වචන,**

- නො දැක්ක දේ දැක්කා කීම.
- නොඇසූ දේ ඇසුවා කීම.
- නොවින්ද දේ වින්ද කීම.
- නොදන්න දේ දන්නවා කීම.
- දැක්ක දේ නොදැක්කා යැයි කීම.

- ඇසූ දේ නොඇසුවා කීම.
- වින්ද දේ නොවින්ද කීම.
- දන්න දේ නොදන්නවා කීම.

රැවටීමේ අදහස මුල් කරගෙන අසත්‍යයක් කීමෙන්, ලිවීමෙන් හෝ අත් පා ආදියෙන් සංඥා කිරීමෙන් හෝ අනුන්ට ඇඟවීමෙන් ද සිල්පදය බිඳෙයි. විහිළුවට වුව ද බොරුවක් නොකිව යුතු බව භාග්‍යවතුන් වහන්සේ විසින් අම්බලට්ඨික රාහුලෝවාද සූත්‍රයේ දී වදාළ සේක.

## 05. මත්පැන් හා මත්ද්‍රව්‍ය භාවිතයෙන් වැළකීමේ ශික්ෂා පදය



"මෙම සිල් පදය පළුදු වන්නේ මදයටත් ප්‍රමාදයටත් හේතු වන මත්පැන් හා මත්ද්‍රව්‍ය භාවිත කිරීමෙනි. වර්තමානයේ භාවිත වන මත්පැන් හා මත්ද්‍රව්‍ය (බීඩි, සිගරට්, හෙරොයින්, ගංජා ආදී...) සියල්ලක්ම මෙයට අයත් වේ. එබැවින් ඒවා භාවිත කිරීමෙන් සිල්පදය බිඳෙයි."

පංචශීලය පළුදු වන්නේ ඉහත කී ආකාරයන්ටය. ගිහි ශ්‍රාවකයන්ට භාග්‍යවතුන් වහන්සේ අනුදැන වදාළ පංච ශීලය පළුදු වූ බව හඳුනා ගැනීමට මෙම දේශනාව ඉතා වැදගත් වේ. සිහියෙන්, වීර්යයෙන් යුතු ශ්‍රාවකයා තිසරණයත්, තිසරණ සහිත වූ මෙම පංච ශීලයත් දිවි හිමියෙන් ආරක්ෂා කරයි. අවබෝධයෙන් ආරක්ෂා කරයි.

ඒ අනුව තෙරුවන කෙරෙහි නොසෙල්වෙන ප්‍රසාදයත් කඩතොලු නැති, සිදුරු නැති, කැළැල් රහිත වූ පළුදු නොවූ සීලයත් ඇති ආර්ය ශ්‍රාවකයා ඒකාන්තයෙන් ම සතර අපායෙන් මිදී යයි. එනම් ඔහු හෝ ඇය සෝතාපන්න

වූ ශ්‍රාවකයෙකි. ඔහුට ඇත්තේ උපරිම ආත්මභාව හතකි. නියත වශයෙන් ම එම ආත්මභාව හත තුළ උතුම් අරහත්වය සාක්ෂාත් කරයි.

මෙම සදහම් පරියාය තමා තුළට ගළපා බැලීමෙන් මරණින් මතු ඉරණම කෙසේ වේවිදැ යි අපටත් හඳුනාගත හැකිය. ඒ හෙයින් ලද මේ දුර්ලභ අවස්ථාවෙන් හැකි උපරිම ප්‍රයෝජන ගැනීමට අප්‍රමාදී වීම ඉතා වැදගත් වේ.

## උතුම් අෂ්ටාංග ශීලය සමාදන් වෙමු



මෙය ගෘහස්ථ ශ්‍රාවකයාගේ උපෝසථ ශීලය යි. තෙරුවන් සරණ ගිය සෑම ගිහි ශ්‍රාවකයෙක් ම පොහෝ දින උපෝසථ ශීලයෙහි යෙදිය යුතුය. මෙම උපෝසථ ශීලයෙහි ප්‍රධාන ලක්ෂණ කිහිපයකි. පංච ශීලයට අමතරව අලුතින් ම සිල්පද කිහිපයක් එකතු වේ.

පොහෝ දින ඔහු බ්‍රහ්මචාරීව වාසය කරන දිනය යි. එමෙන් ම එදින විකාලයේ ආහාර නොගනී. එය ඔහුගේ උපවාස දිනය යි. එදින ඔහු නැටුම් ගැයුම් වැයුම් වාදන විසූක දර්ශන නැරඹීම් ආදියෙන් වෙන් වී සිටියි. සුවඳ විලවුන් වර්ග, පුයර වර්ග භාවිත නොකරයි. නොයෙක් අයුරින් ඇඟපත සැරසීම් ආදියෙන් ද වෙන්වී සිටියි. සුඛෝපභෝගී සුවපහසු ඇඳපුටු පරිහරණය නො කරයි. රහතන් වහන්සේලා ගත කළ උදාර ජීවිත සිහිකරමින් ය ඔහු මෙසේ කල්ගත කරන්නේ.

# නොකල් අටකි සදහම් මඟ යා නොහැකි



සම්මා සම්බුදුරජාණන් වහන්සේ නමක් ලොව පහළ වී සියලු සත්වයන් සසර දුකින් මුදාලන ශ්‍රී සද්ධර්මය දේශනා කොට භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා යන සිව්වනක් පිරිසෙන් සමන්විතව සම්බුද්ධ ශාසනය පිහිටුවාලීමත්, කෙළවරක් නොපෙනෙන සසරක ඉපදෙමින් මැරෙමින් ගමන් කරන සත්වයාට සම්බුද්ධ ශාසනයක් හමුවීමත් ඒ සම්බුද්ධ ශාසනයේ ශ්‍රාවකත්වයට පත්වීමත් සසර දුක් කෙළවර කොට නිවන් මඟ සාක්ෂාත් කිරීමත් කෙතරම් දුර්ලභ ද?

භාග්‍යවතුන් වහන්සේ ඒ පිළිබඳ අක්ඛණ සූත්‍රයේ දී මෙසේ පෙන්වා දෙන සේක. "මහණෙනි, අශ්‍රැතවත් පෘතග්ජනයා 'ලෝකය සුදුසු අවස්ථාවේ ඇත්තේය' යැයි කියති. නමුත් ඔහු සුදුසු අවස්ථාව හෝ නුසුදුසු අවස්ථාව නොදනී. මහණෙනි, නිවන් මඟේ හැසිරෙන්නට කාලය නොවූ නුසුදුසු වූ අවස්ථා අටක් ඇත්තේ ය.

මහණෙනි, මෙහිලා අරහත් වූ, සම්මා සම්බුද්ධ වූ, විජ්ජාචරණ සම්පන්න වූ, ලෝකවිදූ වූ, අනුත්තරෝ පුරිසදම්ම සාරථී වූ, දෙව් මිනිසුන්ට ශාස්තෘ වූ, බුද්ධ වූ, භාග්‍යවත් වූ බුදුරජාණන් වහන්සේ ලෝකයෙහි උපන්නාහු වෙති. කෙලෙස් සංසිඳවන්නා වූ පිරිනිවනට හේතු වන්නා වූ සත්‍යාවබෝධය කරවන්නා වූ සුගතයන් වහන්සේ විසින් දෙසන ලද ධර්මය දේශනා කරනු ලබයි. එකල් හී,

01. මේ පුද්ගලයා නිරයෙහි උපන්නේ වෙයි. මෙය නිවන් මඟ හැසිරෙන්නට නුසුදුසු පළමු අවස්ථාවයි.
02. මේ පුද්ගලයා තිරිසන් යෝනියේ උපන්නේ වෙයි. මෙය නිවන් මඟ හැසිරෙන්නට නොකල් වූ නුසුදුසු දෙවැනි අවස්ථාව යි.

03. මේ පුද්ගලයා ප්‍රේත විෂයෙහි උපන්නේ වෙයි. මෙය නිවන් මඟ හැසිරෙන්නට නොකල් වූ නුසුදුසු තෙවැනි අවස්ථාවයි.

04. මේ පුද්ගලයාත් එක්තරා දීර්ඝ ආයුෂ ඇති දෙව්ලොවක (අසඤ්ඤතලයෙහි) උපන්නේ වෙයි. මෙය නිවන් මඟ හැසිරෙන්නට නොකල් වූ නුසුදුසු සිව්වෙනි අවස්ථාවයි.

05. යම් තැනක භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකාවන්ගේ ගමනක් නැද්ද, එබඳු වූ අතිශයින් අඥාන වූ ම්ලේච්ඡ වූ ප්‍රත්‍යයන්ත ජනපදයන්හී මේ පුද්ගලයාත් උපන්නේ වෙයි. මෙය නිවන් මඟ හැසිරෙන්නට නොකල් වූ නුසුදුසු පස්වැනි අවස්ථාවයි.

06. මේ පුද්ගලයාත් මධ්‍ය දේශයෙහි (බුදු දහම පැතිරී යන සීමාව) උපන්නේ වෙයි. නමුත් විපරීත දැකුම් ඇති මිථ්‍යා දෘෂ්ටිකයෙක් වෙයි. මෙය නිවන් මඟ හැසිරෙන්නට නොකල් වූ නුසුදුසු සයවැනි අවස්ථාවයි.

07. මේ පුද්ගලයාත් මධ්‍ය දේශයෙහි උපන්නේ වෙයි. නමුත් හේ ජඩ වූයේ, කෙළතොළු වූයේ, ප්‍රඥාවෙන් තොර වූයේ වෙයි. මෙය නිවන් මඟ හැසිරෙන්නට නොකල් වූ නුසුදුසු හත්වැනි අවස්ථාවයි.

08. මේ පුද්ගලයා ජඩ නොවූ, කෙළතොළු නොවූ, ප්‍රඥාවන්තයෙක්ව බුදුරජාණන් වහන්සේ නමක් පහළ නොවූ කාලයක මධ්‍ය දේශයෙහි උපන්නේ වෙයි. මෙය නිවන් මඟ හැසිරෙන්නට නොකල් වූ නුසුදුසු අටවැනි අවස්ථාවයි.

# මේ එකම අවස්ථාවයි



"මෙහිලා අරහත් වූ සම්මා සම්බුද්ධ වූ විජ්ජාචරණ සම්පන්න වූ සුගත වූ ලෝකවිදූ වූ අනුත්තර පුරිසදම්මසාරථී වූ දෙව් මිනිසුන්ට ශාස්තෘ වූ බුද්ධ වූ භාග්‍යවත් වූ තථාගතයන් වහන්සේ ලෝකයෙහි උපන්නාහු වෙති. කෙලෙස් සංසිඳවන්නා වූ පිරිනිවීමට හේතු වන්නා වූ සත්‍යාවබෝධය කරවන්නා වූ සුගතයන් වහන්සේ විසින් දෙසන ලද ධර්මය ද දේශනා කරනු ලැබෙයි. එකල් හී මේ පුද්ගලයාත් මධ්‍ය දේශයෙහි උපන්නේ වෙයි. හේ ජඩ නොවූ, කොළතොළු නොවූ, ප්‍රඥාවන්තයෙක් වෙයි. මනා ලෙස පැවසූ දෙයෙහිත්, නොමනා ලෙස පැවසූ දෙයෙහිත් අරුත් හඳුනාගන්නට සමර්ථ වෙයි. මේ වනාහී බඹසරයෙහි වසන්නට ඇති එක ම සුදුසු අවස්ථාවයි. එක ම කාලයයි."

(අක්ඛණ සූත්‍රය - අංගුත්තර නිකාය 05)

අපි ද නිරයෙන් මිදී, තිරිසන් ලෝකයෙන් මිදී, ප්‍රේත ලෝකයෙන් මිදී, දීර්ඝායුෂ ඇති අසඤ්ඤතලවල නො ඉපදී, මිනිසත් බව ලැබුවෙමු. එමෙන් ම භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා යන සිව්වනක් පිරිස ඇසුරු කිරීමට ද භාග්‍යවන්ත වීමු. බුදු දහම අසන්නට දකින්නට නොලැබෙන ප්‍රත්‍යන්ත දේශයන්ගෙන් මිදී අරුත් විකෘති නොවූ ආකාලික ශ්‍රී සද්ධර්මය අසන්නට ද වාසනාවත්ත වීමු. නොයෙකුත් විපරීත මිථ්‍යා ව්‍රතවලින් මිදී සම්මා දිට්ඨිය කුමක්දැයි දැන ගැනීමට ද අපට අවස්ථාව ලැබී ඇත. දහමේ හැසිරීමටත්, නොමනා ලෙස පැවසූ දෙයෙහි අරුතත් මනා ලෙස පැවසූ දෙයෙහි අරුතත් වටහා ගැනීමට ඔබ භාග්‍යවන්ත නම් ගෞතම සම්මා සම්බුරජාණන් වහන්සේගේ සම්බුද්ධ ශාසනයෙහි උත්තම වූ දායාදය ලබාගැනීමට ඔබටත් දුර්ලභ වූ වාසනාව හිමි වී ඇත. මේ ඒ සඳහා සුදුසු කාලය යි..



# සෙනෙහෙබර
# ආමන්ත්‍රණය

# ආදරණීය දුවේ... පුතේ...

දයාබර දරුවනි, ජීවිතය යහපත් කර ගැනීමට, සුන්දර කර ගැනීමට ඔබ දරන උත්සහයට මහත් අස්වැසිල්ලක් ගෙන දෙන දයාබර කැපකරු දෙමාපියන් ඔබ වෙනුවෙන් එවූ තවත් සටහනක්...

*නමෝ බුද්ධාය !*

*නුදුටු මගේම පුතුට සෙනෙහසින් ලියමි,*

*ඔබගේ ශ්‍රද්ධා අධ්‍යාපන ශිෂ්‍යත්ව වැඩසටහනට දායක වන කැපකරු මව මම වෙමි.ඔබ වැනිම පුතුන් දෙදෙනෙකුගේ මෑණියන් වන මා ඔබත් මගේම පුතෙකු ලෙසින් පිළිගනිමි.*

*ඔබට ලිවීමට වසරක් පමාවූවාට අමනාප වෙන්න එපා.මම රජයේ රැකියාවක නියතු ඉතාමත් කාර්යබහුල කෙනෙක්. උසස්ම යැයි පිළිගන්නා රැකියාවක් කලත් මා ද ඉතාමත් දුගී පවුලක දරුවෙකු ලෙස අධ්‍යාපනය ලබාගත් අයෙක්. ඔබ සේම කැපකරු මවකගේ මුදල් ආධාරයෙන් උසස් අධ්‍යාපනය ලබා ඉගෙනගෙන සමාජයට අද ලොකු සේවාවක් කරන කෙනෙක්.*

*ඉතින් මම එදා හිතුවා කවදාහරි මමත් ඒවගේ දරුවන්ට ඉගෙන ගන්න උදව් කරනවා නියලා. ශ්‍රද්ධා මාධ්‍ය ජාලයේ ලොකු ස්වාමින් වහන්සේට පිංසිදුවන්නට මට ඒ හැකියාව ලැබුනා.පුතේ ඔයත් ඒ වගේ හොඳින් ඉගෙන ගෙන මොනයම් හෝ රැකියාවක් කරලා දවසක ඔයාගේ ඒ යුතුකම සමාජයට ඉටු කරන්න හිතා ගන්න.*

*ඔයා මට එවූ ලිපි ලැබුණා. ඉතාමත් සතුටුයි ඔයා ගැන. ඒ වගේම දිගින් දිගටම ලිපි ලියාව් කියල මම බලාපොරොත්තු වෙනව. ගෙදර තොරතුරු මොනවාද? දිගටම ඔයාට උදව් කරන්න බලාපොරොත්තු වෙනවා. ඔයාටත් පවුලේ සැමටත් තෙරුවන් සරණයි.*

*මෙයට,*

*ආදර අම්මා.*

# ආදරණීය අම්මේ... තාත්තේ...

දරුවන්ගේ සිත් සතුටින් පිරී ඇත. ඒ ඔවුන්ට සෙනෙහෙවන්ත වූ තවත් අයෙක් මුණගැසුණ නිසාය. මේ දුවා දරුවන් යම් දිනෙක දී යම් තැනක සිටී ද ගුණයෙන් නුවණින් වැඩී සිටී ද, එදාට ද ඔවුන් මහත් සෙනෙහසකින් ඔබ සිහි කරනු ඇති. ආදරණීය දෙමාපියනි, ඒ පින සසර කෙළවර කර ගැනීමට උපකාරයක් ම වේවා!

මේ අකුරු වී ඇත්තේ තවත් සෙනෙහෙවන්ත හැඟීමකි.

*නමෝ බුද්ධාය !*

*කියා දුනි අරුත් නුඹ මට - ජීවිතේ මුල මැද ඉඳන්*
*දිනන්නට මට අවැසි ශක්තිය - නිරන්තර දුනි ළඟ ඉඳන්*
*ණය ගැතියි මගේ මව්නි පියාණෙනි - ඔබේ මෙහෙයට මම ඉතින්*
*පතන්නෙමි ඔබ හට දිගාසිරි - සිටිනු මැන නිදුකින් තුටින්*

*ආදරණීය පින්වත් මාගේ කැපකරු අම්මේ තාත්තේ,*

*ඔබ ගැන හදවතේ ඇති අප්‍රමාණ ආදරයෙන් සෙනෙහසින් බිඳක් පමණක් මෙලෙස අකුරු කළේ, ඒ සම්පූර්ණ හැඟීම අකුරු කිරීමට තරම් මෙම පුංචි කඩදාසි පිටුව මදි බැවිනි. නිම් තෙරක් නොපෙනෙන මේ ලොවේ ඉපිද කවරදාකවත් නොදුටු කාගේ කවුරුන්දැයි හරි හැටි නොදැන මෙලෙස මා හට උපකාර කරන ඔබ සැබවින්ම ඉතා ත්‍යාගශීලීය.*

*ඉතින් අම්මේ තාත්තේ, මාගේ ජීවන අඳුරු මාවතට මිණි පහනක් ලෙසින් දැල්වී මා හට දුන් සහයෝගය කිසිම දිනක මාගේ හදවතින් මැකී නොයනු ඇත. නිර්මල වූ බුදු හිමිගේ පිහිටෙන් මෙවන් සුපින්බර කාර්යයන් සිදුකරන්නට තව තවත් ශක්තිය ඔබට ලැබේවා. මගේ දයාබර කැපකරු මව පියා විසින් මෙම මාසයට මා*

හට ලබාදුන් රු.1850 මුදලින් රු.1400 මාගේ පන්ති ගාස්තු සඳහාත් රු.100 මාගේ නැගණියටත් තවත් රු.100කින් ගමේ බුදු මැදුරට පොල්තෙල්, හඳුන්කූරු, පහන්තිර ද ලබාදුනි. රු.50 තැපැල් ගාස්තු සඳහා වැයකළ අතර ඉතිරි රු.200 බස් ගාස්තු වශයෙන් මා සන්තකයේ තබාගතිමි.

මා දයාබර කැපකරු මව පියා විසින් මා හට මාසිකව ලබාදෙන මෙම ශිෂ්‍යත්ව මුදලින් යම් කොටසක් පිනකට යොදවන්නේ පළමු කොටම මාගේ කැපකරු අම්මාට තාත්තාට පින් පතමිනි. එපමණක් නොව දිනපතා බුදුන් වැඳ මම ප්‍රාර්ථනා කරන්නේ මේ භයානක රුදුරු සසරින් එතෙර වී උතුම් වූ නිවන් මගට ඔබහට දොරටු විවර වේවා! කියාය. ඔබ මහන්සි වී දහදිය වගුරා උපයන මුදලින් කොටසක් මා වෙනුවෙන් වැය කරනා ඔබට දහස් වාරයක් නොව අනන්ත අප්‍රමාණ වාරයක් පුණ්‍යානුමෝදනා කළද එය මදි බැව් මා දනිමි. නමුත් මා හැකි සෑම විටම යම් පිනක් සිදු කොට ඒ ආනිසංස ඔබ නමට පින් දීමට මා උත්සුක වෙමි.

ආදරණීය අම්මේ තාත්තේ මෙතැනින් මා අදට නවතින්නේ ඔබට නිදුක් නීරෝගී වාසනාවන්ත අනාගතයක් පතමිනි.

තෙරුවන් සරණයි !

මෙයට විශ්වාසී දයාබර දියණිය
ඉෂානි මධුෂිකා.

තමන් ලද ශ්‍රද්ධා අධ්‍යාපන ශිෂ්‍යත්ව මුදලින් හැකි පමණින් පින්කමක් සිදුකළ ආදර්ශවත් දැරියක් තම කැපකරු දෙමව්පියන් වෙත එවන ලද ලිපියකින් උපුටා ගත් කොටසක්...

*පසුගිය මස නොසිතූ මොහොතක මුණ ගැසුණු අයෙකු වෙනුවෙන් පිහිටක් වන්නට මා හට හැකි විය. ඒ මා පාසල වෙත යනවිට පාර අයිනේ කෙඳිරිගාමින් සිටි අසරණව සිටි පුංචි බලු පැටවකු වෙනුවෙනි. ඌගේ දකුණු පාදය වාහනයකට යට වීම නිසා ශරීරයෙන් වෙන්වන තරමට කැඩී තිබිණි. මට ඌ මුණ ගැසෙන විට වෙලාව උදෑසන 7.25 පමණ විය. මා හට තවත් කිලෝමීටර් භාගයක් පමණ පයින් යාමට ද ඉතිරිව තිබිණි. මම බලු පැටවා දෙස බලන විට මට හැඟී ගියේ ඌ දින ගණනකින් හරි හැටි වතුර පොදක් ද නොලද අයුරකි. එම නිසා මම ආපසු කඩයක් සොයා ගොස් ඌට කෑමට බනිස් ගෙඩි 2ක් හා ජල භාජනයක් ද ගෙනවිත් දී අසල නිවසකින් ඌගේ පාදයට බෙහෙත් දමා වෙළුමක් ද කර එහි තබා, සවසට රැගෙන යාමට තැබුවෙමි. නැවත මා පාසලට යනවිට පෙ.ව. 8.45 වීම නිසා විදුහල්පතිතුමාගේ දඬුවමට ද බඳුන් විය. නමුදු මගේ සිත පිරී ගියේ ඒ බලු පැටවා මා දුන් අහරින් කුස පුරවාගෙන ස්තූතියි කියන්නාක් මෙන් වේදනා බර දෑසින් මා දෙස බැලූ අන්දමයි. ඌට දැන් ඇවිදගත හැකිව මා හැරදා ගොස් සිටියද, සැමදා මට ඒ අහිංසක දෑස මැවී පෙනෙයි.*

*කැපකරු මව්පියවරුනි, ඒ අහිංසකයාට ජීවිතය ලැබුණේ ඔබ නිසාමය. ඔබ මවෙත පෑ සෙනෙහස, දයාව, අනුකම්පාව හා ලෙන්ගතුකමින් උගත් බොහෝ දෑ අද මම නිර්ලෝභීව සමාජයට දායාද කරන්නෙමි. ඒ පුණ්‍යානුමෝදනාව ඔබටම වන්නේය.*

*ඔබට සදා දිගාසිරි වේවා !*

*මීට සිසුවිය,*
*ධනංජනී.*

# නිර්මාණ ඉසව්ව

පැදියෙන් සිතුවමින් නිසඳැසින්
සුසැදි ඔබේ නිර්මාණ එකතුව

වැලි කතරක් ගෙවා යන්නට
හිරු එළිය සැඬ පහරකි මට
එහි දිය පොදක් වූ ඔබ
රැක දුනෙමි දිවිය මාගේ
දිවි කතරින් එතෙර වන්නට

පියඹා යාමට කිරිල්ලියක මෙන්
ජීවිතයේ හිණි පෙත්තට
අත්වැලක් වන ඔබ
මෑණියනි, පියාණෙනි...
රකින්වා දෙවියන් සදා...

මලින් මලට පියඹා
රොන් සොයා ඉගිලීමට
පියා තටුවකි ඔබ මට
මෑණියනි, පියාණෙනි...
පතමි දිඝායුෂ ඔබට
හද බැතින් පින් කෙත්
ඔබේ දියණිය වන මම...

ශාමලී දියණිය

## බලාපොරොත්තුව...

නැංගුරම් ලා තිබුණ සරසවියෙ නෞකාව දක්වලා
ගුරු දෙමව්පිය කීවා
යන්න පුතුනි කියා
දිරි ගතිමි එදා මා
ඒ දිරිය පෙරටු කොට එනමගදී අතරමග
මුණ ගැසුණ ඔබ දෙපළ
රැකුලක්ය මෙමාහට
මගේ මේ මාවතේ
එකී ඒ නෞකාව
දුර නොවේ
පේන මානයේ තිබෙයි
නමුත් එම ගැඹුරු දිය කඩඉම්ය ගෙන එන්නේ
ජයග්‍රහණය පතා
දෙදණ තෙක් දියේ බැස
පිය මනිමි ඒ දෙසට
නැග ගනිමි නැව් කුසට
නුහුරු බව නිසාවෙන්
විටෙක දිය රැලි ඒවි
ඒ වුවද
රුවල වෙත පණ පොවා
ගමනාන්තය සොයා
යන්නෙමී
ගොඩබිමේ උස්බිමක
තිබෙන ඒ සරසවිය
සොයා මා යන්නෙමී
සත්තමයි
මව්නි පියාණෙනි මා
යන්නෙමී...

ධනංජනී නයෝමි දියණිය

## සදහම් අමා රස...

සදහම් අමා රස
දෙසයි නිසි යහ මග
සුවයයි නිවන සසර
වදාරයි බුදු බණ යහමග

නිති දෙසනා දහම
නිසා පුතාටයි ලක් දෙරණ
ධර්මද්වීපයයි මේ බිම
පින් කෙතයි මේ හෙළ ලක් දෙරණ

හද නැවෙනා විට
උතුම් සදහම් මී හදවතට
සුවය ගෙනෙයි
දිවි කෙම්බිමට

මේ පින් බිම
පින් කෙතයි සිහල අපේ
උරුමේ
නමදිමු නමදිමු
බුදු පියුම් සැමදා...
සැරදේවා ! සැරදේවා !
බුදු බණ
නිති මේ ලක් මව් සෙවණේ
සැරදේවා ! සැරදේවා !
බුදු බණ
නිති මේ ලක් මව් සෙවණේ...

ජී. චමොදි සසිනි දියණිය

සුන්දර සොබාදම් මාතාවක ඉපදුණත් මා
පුංචි දා සිට තනිව සිටි මා
සියල්ලන්ගේ ආදරය දිනුවත්
අන් සවිය පැතුවේ නෑ කිසිදා
අහිමි වුවත් මව්පියන්ගේ සෙනෙහස
වැලපුණේ නෑ ඉවසුවා දෛවය
දුක් ඇතත් මට ලොව තුළ
සිනාසෙමි කඳුළු කැට දෝතින් ගෙන
සියල්ලන්ගේ ආදරය මගේ සිතහවට හිමි
ගුණදමින් සිනාසුණු නිසාවෙනි
උත්සහය අත්නොහැර දිවියේ
දුක් කඳුය පසු කරන්නෙමි මා
ජීවිතය ජයගන්න පසු දින
ආදරය කළ සැමදෙනා හට
දුක් නොදෙමි මා කිසි දිනෙක
වනමල් අතර සුවඳැති මලක් වී
යම් දිවිය පුරා චරිතවත් බව රැක
සිනාසෙමි මුදු නෙළුම් පෙත්තක විලස
අන් සැමත් සමගින් සදා මගේ හද

තක්ෂිලා දියණිය

ඔබ කැමති මාතෘකාවකින්
කවි, නිසඳැස්, කෙටිකතා, චිත්‍ර ආදී ඕනෑම නිර්මාණයක් ශ්‍රද්ධා අධ්‍යාපන ශිෂ්‍යත්ව අංශය වෙත යොමු කරන්න.

ශ්‍රද්ධා සමාජ සත්කාර අංශය,
නො. 369, හේවාගම, කඩුවෙල.
www.shraddha.lk
edu@shraddha.lk



## නොනිම් මේ මහා සංසාරය...

*නිවෙන මතුවන කෙලෙස් ගිනිමැද*
*නැවෙන අළුවන බවක් නොම දැන*
*තෙරක් නොපෙනෙන ඉමක් නොහැඟුන*
*ජීවිතය නම් නැවක් පදවන*

*වරෙක පෙණපිඩු නැමති සැපතය*
*විටෙක දුක්ඛය නැමති සැඩ රළ*
*නැගෙන මතුවන මහා සයුරකි*
*නොනිම් මේ මහා සංසාරය*

*වියරුවෙන් මත් වී රාගයෙන්*
*නිමාවක් නැති ආශාව පොදිබැඳ*
*එකිනෙකා වෙත වැඩුණු ක්‍රෝධය*
*රැගෙන යයි දුගතියට දිවිනැව*

*සසර සයුරෙහි අතර මැදි වුණ*
*මං මුලා වූ නැවයි දිවි මග*
*එකී ඒ නැව දකී ගොඩබිම*
*බුදුන් දෙසූ ශ්‍රී අමාධර්මය...*

ආර්.ඩී. සඳුන් මධුවන්ත පේමරත්න



ශෂික ලක්ෂාන් ජයසිංහ

# නිදහස

සොයා පියනගමු

දයාබර දුවේ, පුතේ,

අපේ ජීවිතවල ගෙවුණ හැම අවුරුද්දක ම වගේ මේ අවුරුද්දෙත් නිදහස් දිනයක් සමරන්නට ලැබුණා. ශ්‍රී ලංකාවේ හැට නවවැනි නිදහස් දිනය වෙනුවෙන් මේ අවුරුද්දෙත් දුවලා පුතාලට නිවාඩුවක් ලැබුණා. පාසලේ පන්තියේ වැඩකටයුතුවලින් ටිකක් නිදහස් වෙලා නිදහසේ හිටපු දවසක් බවට ඒ දවස පත්වුණා වන්නත් ඇති. නිදහස් උත්සවවලට සහභාගී වන්න හෝ ඒ නිමිති කරගෙන පැවැත්වුණු පුණ්‍ය කටයුතුවලට සහභාගී වන්න දුවට පුතාට ඉඩ ලැබෙන්නත් ඇති. කොහොම හරි, මේ පාරත් ජාතික නිදහස් දිනය අපි කාට කාටත් විශේෂ දිනයක් බවට පත් වුණා.

## මේ නිදහස සැමදා නැත

දුවේ, පුතේ... ශ්‍රී ලාංකිකයන්ට මේ නිදහස් දිනය සමරන එක තව කොච්චර කාලයක් ඉදිරියට සිදු කරන්න පුළුවන් වේවි කියල ද ඔයාලට හිතෙන්නේ? 'ලෝක විනාශය වෙනකල්...' කියලා ඔයාලට හිතෙන්න ඇති... තව තව උත්තරත් හිතට එන්න ඇති. දුවේ, පුතේ, ඇත්තටම නම් මේ නිදහස අපට අයිති අප යළි යටත්විජිතයක් නො වී සිටින තාක් කල් පමණයි. හිතන්න, හිටිහැටියේ කඩා වදින ප්‍රබල ආක්‍රමණිකයන් පිරිසක් විසින් අපව යටත් කර ගත්තොත් (තෙරුවන් සරණින් අප උපන් රටට එවන් විපතක් නොවේවා!) මේ නිදහස් දිනය අපට අහිමි වෙනවා නේ ද? එදා පටන් අප නැවතත් නිදහස සොයාගෙන යන ජාතියක් බවට පත්වනවා. ඒ නිදහස් අරගලය ජය ලබන යම් දවසක් උදා වුණා ම අන්න ඒ දවස අපේ නිදහස් දවස බවට පත් වෙනවා. ඒ දවස පෙබරවාරි 4 වනදා ම වන්නට තිබෙන ඉඩ තුන්සිය හැටපහෙන් එකක් පමණයි...

ඒ කියන්නේ දුවේ පුතේ මේ නිදහසත් තාවකාලිකයි... ඉතිහාසයේ සිදුවුණ බොහෝ දේ ගැන අහලා තියෙන, කියවලා තියෙන ඔයාලා දන්නවා අපේ ඉතිහාසයේ අරුණෝදයේ ම සේන

ගුත්තික කියන වෙළඳුන් දෙදෙනා අනුරාධපුර රාජධානියට පහර දී යටත් කර ගත්තා. අවුරුදු 22ක් පුරා ඔවුන්ගේ පාලනය පැවතුණා. ධාර්මික අසේල රජු ඔවුන් පරදවා රාජධානියත්, රටත් නිදහස් කර ගත්තා... ඒ කාලයේ නිදහස් දිනය කියලා අසේල රජු ජය ලැබූ දිනය නම් කෙරුවා වන්නටත් පුළුවනි...

## කලින් කල අප සෙවූ නිදහස

ඊට පස්සෙ ආයෙමත් එළාරගේ ආක්‍රමණයෙන් අනුරාධපුර රාජධානියේ බලය හෙළයන්ගෙන් ගිලිහුණා. වසර 44ක් පුරා ඔහු රාජ්‍යය කරවද්දී රුහුණු, මායා, පිහිටි කියන මේ තුන් සිංහලයේ වැසියන් කී දෙනෙකුට නම්, කී වරක් නම් සිතෙන්න ඇති ද 'නිදහස ලබන්න ඕනි' කියලා...! ඒ සිතුවිල්ල තිබුණු විහාරමහාදේවියගේ කුසින් ඒ සිතුවිල්ල ම තිබුණ කාවන්තිස්ස රජුට දාව පින්වන්ත ගාමණී අභය කුමාරයා මාගම රාජධානියේ කිරුළ හිමි කුමාරයා උපන්නේ ඒ නිදහස් අරගලයට පණ පොවන වීරත්වය උරුම කරගෙන. අති මානුෂීය යුද්ධයකින් පසුව මේ වීරයා තුන්හෙළය එක්සේසත් කොට අනුරාධපුරයේ රාජ්‍යත්වයට පත් වුණා. ඒ කාලයේ, ගාමණී අභය රජු එළාර පරදවා ජය ලැබූ දිනය නිදහස් දිනය ලෙස සැලකුවා වන්නටත් පුළුවනි...
ආයෙමත් පොළොන්නරු යුගයේ දී කාලිංග මාඝගේ දරුණු ආක්‍රමණයෙන් බැට කද්දී එයින් නිදහස් වන්න කී දෙනෙක් නම් පෙරමුණ ගන්න ඇති ද... දෙවන පරාක්‍රමබාහු රජු සේනාව මෙහෙයවා සතුරු බළමුළු පරදවා යළිත් නිදහස උදා කරලූවා. ඒ දවස ඒ කාලයේ නිදහස් දවස වන්නට ඇති...

## වටින්නේ සදාකාලික නිදහසයි

කලින් කල නොයෙක් ආක්‍රමණ... කලින් කල නොයෙක් උපද්‍රව... කලින් කල නොයෙක් උවදුරු... මේ දේවල් හමුවේ කලින් කල අප යටත් ජාතියක් බවට පත් වී තිබෙනවා. ඒ වගේ ම යම්

කලකට පසු, පසුනොබස්නා උත්සාහයෙන්, වීර්යයෙන් කටයුතු කළ මිනිසුන්ගේ ව්‍යායාමයට පුණ්‍යානුමෝදනා වන්නට අප ඒ සියල්ලෙන් ම නිදහසත් ලබා තිබෙනවා... ඒ කියන්නේ, කලින් කල අපට වෙන් වෙන් වූ නිදහස් දින පැවතියා විය හැකියි. ඉදිරියේදීත් කවරක් වේවි ද කියා අප නිසැකව ම දන්නේ නැහැ. ඒ නිසා, මේ නිදහසත් - නිදහස් දිනයත් අතිශයින් ම තාවකාලික පදනමකින් අපට උරුම වූ බව අප තේරුම් ගත යුතුයි...

මේ කියන්නේ ලැබූ නිදහස අගය කරන්න එපා කියලා නෙමෙයි. එහෙමත් නැති නම් ඒ නිදහස සමරන්න එපා කියලත් නෙමෙයි. තාවකාලික නිදහසකින් අපට ලැබෙන්නේ තාවකාලික සතුටක් ම පමණයි. ඒ නිසා, අප සදාකාලික නිදහසක් සොයා ගැනීම ම යි නේ ද වටින්නේ...!

## සදාකාලික නිදහසක් තිබෙනවා ද?

දැන් ඔයාලට පුංචි ප්‍රශ්නයක් ඇති... හැමදේම වෙනස් වෙන මේ ලෝකයේ එහෙම සදාකාලික නිදහසක් තියෙනවා ද? දුවේ, පුතේ, ඔව්...! මේ ලෝකයේ... සියල්ල ම අඛණ්ඩ ව වෙනස් වන මේ ලෝකයේ කිසිවකින් නොවෙනස් වන සදාකාලික නිදහසක් තිබෙනවා ම යි. පුදුමයි නේ ද? ඊටත් වඩා පුදුම වන්නටත්, සතුටු වන්නටත් කාරණයක් තිබෙනවා. ලෝකයේ ජීවත් වන අන් කිසිම පිරිසකට වඩා ඒ සදාකාලික නිදහස සමීපව තිබෙන්නේ ලක්වැසියන්ටයි...

දුවේ, පුතේ අප මේ කතා කරන නිදහස ලෝකයේ කිසිවෙකුට කිසිවකින් ආපසු හැරවිය නො හැකියි. මේ තාක් අපේ ජීවිතවල නිදහස නැති කරගෙන සොයාගෙන ගිය ඉලක්ක තිබෙනවා. පුංචි ම කාලයේ දී පාසලේ තුන වසරට, හතර වසරට යන විට අපට ශිෂ්‍යත්ව විභාගය අභියෝගයක් වුණා. එක වසරේ, දෙක වසරේ ඉද්දි සෙල්ලමට තිබුණ නිදහස අපට නැති වුණා. ශිෂ්‍යත්ව විභාගය ඉවර වුණාට පස්සේ අපට සාමාන්‍ය පෙළ විභාගයට සූදානම් වෙන්න

සිද්ධ වුණා. ඔයාලා හැමෝටමත් එහෙමයි. මේ කාලයේ නම් සාමාන්‍ය පෙළ විභාගයේ සාමාර්ථයන් දැනගන්නටත් කලින් ම ඊළඟ කඩයිමට සූදනම් වෙනවා. ඒ තමයි උසස්පෙළ විභාගය. එතැනිනුත් මේ දේවල් ඉවර වෙන්නේ නැහැ. සරසවි ප්‍රවේශය, රැකීරක්ෂා කටයුතු, ආවාහ විවාහ, අලුත් පරම්පරාවක් ආදි වශයෙන් මරණය දක්වා ම අපට අලුත් අලුත් ඉලක්ක අඩුවක් නො වී ම මුණගැසෙනවා. ඒ ඉලක්ක එකින් එක ජයගත්තා කියා විශේෂ නිදහසක්, විශේෂ සුවපහසුවක් අපට දැනුණේ නැහැ... නමුත්, ඒ ඉලක්ක ජය ගැනීම මේ ජීවිත තුළ යම් සාර්ථකත්වයක් අත්පත් කර ගන්නට උපකාරී වනවා. ඒ නිසා, අප ඒ ඉලක්ක උපරිමයෙන් ජය ගැනීම බොහෝම වැදගත්. ඒ අතරේ ම, මේ ඉලක්ක ජයගැනීම් තුළින් අපට අත්පත් කර ගත නො හැකි ඒ සීමාමායිම් රහිත නිදහස කරාත් යොමු වුණු වැඩපිළිවෙළක අත්නොහැර ගමන් කිරීම අප විසින් කළ යුතු ම දෙයක්.

## පොදු දුක ඉක්මවා යමු

දුවේ පුතේ, ජීවිතයේ මේ ඉලක්ක ජයගැනීම අපට මිල මුදල් වස්තුව උපයා ගන්නට, සමාජයීය වශයෙන් පිළිගැනීමක් ඇති තත්ත්වයකට පත් වන්නට උපකාරී වන බව සැබෑවක්. හැබැයි ඒ කිසිවකින් අප සසර දුකට පත්වන එක වැළකෙන්නේ නැහැ. දුවේ පුතේ, ඒ ලබන ජයග්‍රහණ සියල්ල ම අපට මරණයත් සමඟ අහිමි වනවා. හරි හම්බ කළ ධනය, උපාධි, තනතුරු, ගරු නම්බු නාම යන කිසිවක් අපට මරණයෙන් එපිටට ගෙන යන්නට පුළුවන්කමක් නැහැ. කොතරම් වටිනාකම් අප විසින් උපයා ගත්තත් අපට ඒ සියල්ල සදාකාලික කොටගෙන මේ ජීවිතයේ ම සිටින්නටත් පුළුවන්කමක් නැහැ. වයසට යාම, ලෙඩ වීම, මරණය උපන්නා වූ සත්වයන්ට පොදුයි. ඒ සියල්ලෙන් අඛණ්ඩ ව බැට කද්දී ම තමයි අපට මේ ජීවිත යාත්‍රාව ගෙනයන්න සිදු වන්නේ. හැබැයි, සදාකාලික නිදහස තුළ මේ පොදු දුක නැහැ. එය ඉක්මවා ගමන් කිරීමකුයි එහි තිබෙන්නේ.

ඒ නිදහස සොයාගෙන කිලෝමීටර් දහසකටත් වැඩි දුරක් දිවා රැය නො බලා, කුසට අහරක් ලැබෙනවා ද යන්න නො සලකා ගමනේ

යෙදුණු පින්වන්ත මිනිස්සු මිහිමත සිටියා. මේ පුවත ඔබ අසා තිබෙනවා වන්නට පුළුවනි. සැබෑ නිදහස වෙනුවෙන්, එය අත්පත්කර ගැනීම වෙනුවෙන් දිවි දෙවැනි කොට කැපවුණු වීරයෙකුගේ ඒ පුවත අප ඔබට කියන්නට සිතුවේ උතුම් සම්බුද්ධ ශාසනයත්, දුර්ලභ මනුෂ්‍ය ජීවිතයත් ලැබී ක්ෂණ සම්පත්තිය හිමි වුණු මේ මොහොතේ ම මිස අන් මොහොතක ඒ නිදහස ගැන අපට අසන්නටවත් නො ලැබෙන නිසයි...

## නිදහස් නො වී, නිදහස් කියූ බාහිය

බාහිය තරුණයා මාපිය දෙපාර්ශ්වයෙන් ම විශාල ධනයකට උරුමකම් කී කුලපුත්‍රයෙක්. මේ විශාල ධනස්කන්ධය නිසා ම ඔහු වෙළහෙළඳමේ යෙදී උපයනවා දකින්නට දෙමව්පියන් අකැමැති වුණා. ඇත්තටම එසේ ඉපැයීමේ අවශ්‍යතාවක් ඔහුට තිබුණේ ද නැහැ. එහෙත්... තමන්ගේ අතපයේ වීරියෙන් උපයා ගැනීමේ දැඩි කැමැත්තක් ඔහුට තිබුණා. දෙමව්පියන් අකැමැති ව සිටිය දී ම ඔහු නැව් නැගී වෙළඳමට පිටත් ව ගියේ ඒ නිසයි. එහෙත්... මුහුද අතරමඟක දී නැව බිඳී ඔවුන් අනතුරට පත් වුණා. මුහුදේ පිහිනා ගිය බාහිය තරුණයා ගොඩබිමකට ළඟා වුණා. ඔහු ළඟා වුණේ ඉන්දියාවේ බටහිර වෙරළ තීරයේ පිහිටි සුප්පාරක පටුනට.

දුවේ පුතේ, මුහුදු රළ පහරේ පිහිනා එද්දී බාහිය තරුණයා පැලඳ සිටි ඇඳුම් ගැලවී ගියා. නිරුවතින් ගොඩබිමට ආ ඔහුට අඳින්නට ඇඳුම් සොයා ගත හැකි වුණේ නැහැ. දර පතුරුවලින් ඇඳුමක් හදාගෙන ඔහු විළිවසා ගත්තා. ඒ නිසා ම, බාහිය දරුචීරිය යන නම යෙදුණා. වළං කබලක් අතින් ගෙන ඔහු ආහාර සොයාගෙන ගියා. මේ අමුතු මිනිසා දුටු ජනපදවාසීන් ඔහු නිකෙලෙස් කෙනෙකු විය යුතු යැයි විශ්වාස කළා. එසේ සලකා වන්දනාමාන ද කළා. මෙසේ සිදුවන විට ඔහුට ද සිතුණා තමන් නිකෙලෙස් කෙනෙකු විය යුතු බව. නමුත්, නිකෙලෙස් වීම පිණිස සසරේ පෙර ජීවිතයක සම්බුද්ධ ශාසනයක ඔහු සමඟ එක්ව වීරිය කළ වීරියවන්තයෙකු ඒ

වන විට දෙව්ලොව ඉපදී සිටියා. සම්බුදුරජාණන් වහන්සේ පහළ වී දම් සිහනද නැගෙන යුගයක, රහතන් වහන්සේලාගෙන් හිස් නො වූ යුගයක, සසරේ තමන්ව ද වෙර වීරිය වැඩීම පිණිස උත්සාහවත් කරවූ මිතුරා 'තමන් නිකෙලෙස්' යැයි කියා සිතාගෙන දුර්මතයක සිටින බව දුටු ඒ දෙවියා ඔහු ඉදිරියේ පෙනී සිට ඔහු නිකෙලෙස් වී නැති බවත්, නිකෙලෙස් රහතන් වහන්සේලා ලොව පහළ වී සිටින බවත් පවසා සැවැත්නුවරට යනු පිණිස යොමු කළා.

## නිදහස සොයා දුෂ්කර ගමනක

බුද්ධ කියන මිහිරි වචනය, රහතන් වහන්සේලා යන සසරේ ද හුරුපුරුදු වූ වචනය ඇසෙද්දී ම මහත් සංවේගයකට පත් බාහිය එය ඇසූ මොහොතේ ම සුප්පාරක පටුනේ සිට සැවැත්නුවර බලා ගමන් ඇරඹුවා. දිවා රැය නොබලා වෙහෙසී ගමන් කොට ඔහු සැවැත්නුවරට පැමිණි වෙලාවේ සංඝයා වහන්සේලා පිණ්ඩපාතය වැඩම කරනවා. තැනින් තැන "ඒ සම්බුදුරජාණන් වහන්සේ මේ වෙලාවේ කොතැන සිටින්නේ ද?" අස අසා ඔහු ඇවිද ගියා. වෙහෙස නිවා ගන්න, දහය සන්සිඳුවා ගන්න, කුසගිනි නිවාගන්න ඔහු නැවතුනේ නැහැ. පිඬුසිඟා වඩිමින් හුන් සම්බුදුරජාණන් වහන්සේ අබිමුවට පැමිණි බාහිය දාරුචීරිය ධර්මය දේශනා කරන ලෙස අයැද සිටියා. දනය පිණිස වැඩම කරන වෙලාව මිස දහම් දෙසුම පිණිස මෙය වෙලාව නොවන බව සම්බුදුරජාණන් වහන්සේ තෙවරක් ම වදාරද්දී පවා ඔහු ආයාචනා කිරීම නැවැත්වූයේ නැහැ. ධර්මාවබෝධය පිණිස සසරේ පින් ඇති බාහිය දාරුචීරියගේ ඒ පුණ්‍ය මහිමය දුටු සම්බුදුරජාණන් වහන්සේ ගම්භීර දහම් කරුණක් කෙටියෙන් දේශනා කොට වදාළා.

***"පින්වත් බාහිය දැක්කොත් දැක්කා පමණයි. ඇසුවොත් ඇසුවා පමණයි. ආඝ්‍රාණය කළොත් ආඝ්‍රාණය කළා පමණයි. රස වින්දොත් රස වින්ද පමණයි. පහස ලැබුවොත් පහස ලැබුවා පමණයි. සිතුවොත් සිතුවා පමණයි. ඒ කිසිවක කෙලෙස් ඇති නොවීමක් ම යි වන්නේ. ඒ ගැන කෙලෙස් ඇති නොවීමක් නම් වෙන්නේ ඔබ ඒ හේතුවෙන් ඒකට***

***බැඳෙන්නේ නෑ. යම් වෙලාවක ඔබ ඒ කිසිවකට බැඳෙන්නේ නැති නම් ඔබ එතැන නෑ. ඔබ එතැන නැති නම් ඔබ මෙලොවත් නෑ, පරලොවත් නෑ, ඒ දෙක අතරත් නෑ. එවිට ඔබ නිදහස්."***

මෙය අසා අවසන් වද්දී සම්බුදුරජාණන් වහන්සේ හමුවේ සිටියේ නිකෙලෙස් සිතැති රහතන් වහන්සේනමක්. උන්වහන්සේ දරපතුරෙන්, වළං කබලෙන්, ධනය ඉපැයිය යුතු ජීවිතයෙන්, දුර්මතවල ඇලී සිටීමෙන් පමණක් නො වෙයි, ජාති ජරා ව්‍යාධි මරණයන් කරා නැවත පැමිණීමේ අභාග්‍යයෙන් සදහට ම නිදහස් වුණා.

## සැබෑ නිදහස ම ය ලොව උතුම්

දුවේ පුතේ, ඉන් සුළු මොහොතකට පස්සේ බාහිය රහතන් වහන්සේ ගවදෙනක ඇනීම හේතුවෙන් පිරිනිවන් පෑවා. ඒ වන විට උන්වහන්සේ සැබෑ නිදහස ලබා අවසන්... ඒ නිදහස ලෝකයේ කිසිවෙකුට ආපසු හැරවිය නො හැකියි. ඒ නිසයි එය සැබෑ ම නිදහස බවට පත් වන්නේ...

සම්බුද්ධ ශාසනයක පිළිවෙත් පුරන සම්බුද්ධ ශ්‍රාවකයන්ට පමණයි ඒ අසමසම නිදහස දිනාගන්නට අවස්ථාව ලැබෙන්නේ. ඒ නිසා, ඔබ ගෙවෙන හැම මොහොතක ම උත්සුක විය යුත්තේ පින් දහම් රැස්කර ගන්න ම යි. ඒ පින ම යි ඔබට මෙලොව යහපත සලසන්නේ... පරලොව යහපත සලසන්නේ... ඒ වගේ ම සැබෑ නිදහස අර්ථවත් කරවූ නිවන් සැපය ද සලසන්නේ... සිත කය වචනයෙන් යහපතේ ම හැසිරෙමින් පිනෙන් පිරී ගත් දිවි මඟ සැබෑ නිදහසේ මාවත තුළ හසුරුවන්නට ඔබටත් උතුම් තෙරුවනේ ආශීර්වාදය ම වේවා!

# පුණ්‍යක්‍රියා


(නිවැරදි පින්කමකට අත්වැලක්)

## මල් වට්ටියක් සැකසීම


උත්පලවණ්ණා මහරහත් තෙරණින් වහන්සේ ගැන අපි කවුරුත් දන්නවානේ. එතුමිය තමයි ගෞතම බුදුරජාණන් වහන්සේගේ වමත් ශ්‍රාවිකාවන් වගේම ඍද්ධිමත් භික්ෂුණීන් වහන්සේලා අතර අග්‍ර වුණේ. ඒ තෙරණින් වහන්සේගේ සිරුර නිල් මහනෙල් මලක් වගේ ලස්සනයි. එතුමියට ඒ වගේ පැහැයක් ලැබිලා තියෙන්නේ පෙර ජීවිතයක දී පදුමුත්තර බුදුරජාණන් වහන්සේට නිල් මහනෙල් මලක් පූජා කරපු පිනෙන් කියලයි අපදාන පාලියේ සඳහන් වන්නේ. බලන්න, ශ්‍රද්ධාවෙන් හිත පහදවාගෙන කරන පුංචි පින්කමේ තියෙන ආනිශංස. ඔයාලත් පන්සලට, දහම් පාසලට මල් වට්ටි හදාගෙන යනවනේ. ඒත් අපි හැමදාම මල් වට්ටි හදන විදිහට වඩා අලුත් විදිහකට ලස්සන මල් වට්ටියක් සකස් කරන විදිහයි නිවැරදි පිනකට අත්වැලක් සපයන පුණ්‍යක්‍රියාවෙන් ඔයාලට කියා දෙන්නේ.

මල් වට්ටිය හදන්න මල් කඩන්න කලින් ඔයාලගේ අත් දෙකයි මල් වට්ටිය යි සෝදලා පිරිසිදු කරගන්න අමතක කරන්න එපා. ඒ වගේම පරිස්සමට පෙතිවලට හානි නොවෙන විදිහට යි මල් කඩා ගන්න ඕන. මල් කඩද්දි පරමල්, සත්තු හානි කරපු මල්, පෙති කැඩුණු මල් කඩන්න හොඳ නැහැ.

මල් වට්ටිය හදන්න සෝදලා පිරිසිදු කරගත්ත තවත් මල් වට්ටියක් ගන්න. අපි අද කියලා දෙන ක්‍රමයට අනුව මල් අහුරන්නේ වෙනදා වගේ යට ඉඳන් ගොඩ ගහන ක්‍රමයට නෙවේ. නටුව උඩ පැත්තට තියෙන විදිහට වටේටයි. මුලින්ම වට්ටිය මැද එක මලක් තියාගෙන ඒ මල වටේට එක එක මල පිළිවෙළට



පෙති දෙකක් අනිත් මලේ නටුව මැදි වෙන්න අහුරගන්න ඕන. එතකොට මල් එහා මෙහා නොවී පිළිවෙළට රැඳී තියෙනවා. ඔයාලට ඕනි නම් කඩාගත්ත වෙනත් පාට මල් කැමති තැන්වලින් පිළිවෙළට තියාගන්න පුළුවන්. ඒ විදිහට වට්ටිය වටේට නටුව උඩු අතට තියෙන විදිහට මල් අහුරගත්තට පස්සේ ඔයාලට මේ රූපයේ විදිහට දකින්නට පුළුවන්.



දැන් මැද තියෙන කොටස ඉතිරි අනිත් මල්වලින් පුරවලා මල් වට්ටිය අහුරගෙන අවසන් කරන්න ඕන. දැන් අපි මේ විදිහට අහුරගත්ත මල් වට්ටිය බන්දේසියක හරි වෙන මල් වට්ටියක තියාගන්න ඕන. ඒකට තරමක ලොකු බන්දේසියක් අරගෙන නටු උඩු අතට තියලා අපි හදාගත්ත මල් වට්ටිය උඩින් තියලා තද කරගෙන අනිත් පැත්ත හරවාගන්න ඕන. ඊට පස්සේ පරිස්සමට මල් අහුරපු වට්ටිය අයින් කරගන්න. එතකොට ඔයාලට හරි ලස්සනට හැදුණු මල් බන්දේසියක් දකින්නට පුළුවන් වේවි.



දැන් ඔයාලට පුළුවන් ඔයාලගේම අතින් හදාගත්ත මේ වගේ ලස්සන මල් වට්ටියට පැන් ඉහළා අනිත් පූජා එක්ක භාග්‍යවතුන් වහන්සේටත් පූජා කරලා බොහොම ශ්‍රද්ධාවෙන් වන්දනා කරන්න.




# 2016 වර්ෂයේ අ.පො.ස. උ/පෙළ විභාගයට පෙනී සිටි ශ්‍රද්ධා අධ්‍යාපන ශිෂ්‍යත්වලාභී දරුවන්ගේ ප්‍රතිඵල

| ශිෂ්‍යත්ව අංකය | | නම | විෂය ධාරාව | ප්‍රතිඵල |
|---|---|---|---|---|
| 1 | | යූ.ජී. කෝෂිලා මධුභාෂිණී | Commerce | A A A |
| 3 | | ජේ.එම්. ඩිල්ෂාන් මධුෂ වීරරත්න | Commerce | A A A |
| 31 | ii | එම්. එම්. කුසලානි සුබෝධා ධර්මකීර්ති | Arts | A A A |
| 48 | | වයි.එම්.ඒ.ජී. අනෝමා ප්‍රියදර්ශනී අලුත්ගෙදර | Commerce | A A A |
| 275 | | එම්.වී. ඉරේෂා දිල්හානි ජයසේකර | Arts | A A A |
| 346 | | කේ. සඳුන් විජයංග | Commerce | A A A |
| 347 | | කේ.බී. විශ්මිත වීරවංශ | Commerce | A A A |
| 358 | | ඩී.ඒ. සසිඳු දිල්ශාන් වීරසිංහ | Arts | A A A |
| 439 | | ජේ.ඒ.ඒ. ඉෂාර මධුෂංක පුෂ්ප කුමාර | Commerce | A A A |
| 441 | i | එන්.බී. ඉරේෂා රුවන්ති | Commerce | A A A |
| 98 | | ටී.කේ.එම්. අංජුලා නදීශානි | Commerce | A A A |
| 118 | | ඩී.එම්. පසිඳු තරංග ජයරත්න | Commerce | A A A |
| 138 | iii | ඩබ්. චාමර කැළුම් උදයප්‍රිය | Commerce | A A A |
| 141 | | එස්.එච්. සුවිනි ඉමාෂා | Commerce | A A A |
| 415 | | මුෂාන්දිකා කාවින්ද්‍යා | Commerce | A A A |
| 22 | | එස්.එම්. දුලංක සඳමාල් ඒකනායක | Bio | A A B |
| 31 | viii | ජී. මේනකා තිළිණි | Commerce | A A B |
| 44 | | ඩබ්ලිව්.සී. රුවන්තිකා | Commerce | A A B |
| 54 | i | කේ. දිනේෂා හර්ෂනී රුවන් කුමාරි | Arts | A A B |
| 89 | | ඩබ්.ඒ. ඉෂාරා සඳරුවනි | Arts | A A B |

| | | | | |
|---|---|---|---|---|
| 416 | | පී.පී. ඩයේෂි මධුප්‍රභා | Arts | A A B |
| 138 | iv | පී.ඒ. නදීෂා තරිඳුමාලි | Maths | A A B |
| 269 | i | ඒ.ජී. සචිනි හංසනී තිලකරත්න | Commerce | A A B |
| 365 | | ඩබ්.ඒ. චමෝදරී ලක්ෂානි | Arts | A A B |
| 398 | | ටී.එම්.ටී.ජී. මධුෂිකා චතුරාංගනී තෙන්නකෝන් | Arts | A A B |
| 404 | i | ඒ. නිකේතනී දිල්රුක්ෂි | Commerce | A A B |
| 216 | | ඊ. තරිඳු චමීර සම්පත් ඊශ්වර | Technology | A A B |
| 86 | | එච්.කේ. තිවංක විදුරංග සේනාරත්න | Bio | A A C |
| 41 | | ඩී.එම්. පියුමි තක්ෂිලා කුමාරි | Arts | A B B |
| 81 | ii | ඩී.එම්. තාරුකා සඳරශ්මි දිසානායක | Arts | A B B |
| 168 | | වී. දිනුජ සඳරුවන් | Arts | A B B |
| 137 | iv | පී. සුනිරන් වාසන | Commerce | A B B |
| 199 | | ඊ.කේ. දුෂ්මන්ති මධුෂිකා සමරකෝන් | Arts | A B B |
| 309 | | කේ.කේ. සඳුනි මල්කාන්ති | Arts | A B B |
| 326 | iii | එස්.එම්. සුපුනි ශානිකා මදුරංගි | Arts | A B B |
| 52 | | ඩී.එම්. තරංගි රුවන්මාලි දිසානායක | Arts | A B C |
| 326 | v | රුචිනි මදුෂ්කා රාජපක්ෂ ආරච්චි | Arts | A B C |
| 482 | | වී.ඒ. දිල්සුපුන් සම්පත් | Maths | A B S |
| 6 | | ටේෂිනී තත්සරණී හේවාපතිරණ | Technology | B B B |
| 24 | | ඩබ්ලිව්.එස්. මනෝජ් මදුරංග | Bio | B B C |
| 234 | | එච්.පී.ජී. නුවන් මදුෂංක විමලසිරි | Technology | B B C |
| 101 | | ආර්.එම්.එච්.ජී. දිල්ෂාන් මධුසංඛ බණ්ඩාර රාජනායක | Bio | B B C |

| | | | | |
|---|---|---|---|---|
| 441 | iii | කේ.කේ. හසිතා චිරන්දතී | Maths | B B S |
| 427 | i | අයි.ටී.ඩී.වී.යූ.ජී. දර්ශනී අයේෂා ලක්ෂානි | Technology | B C C |
| 434 | | කේ.ජී. ලක්මා තිලාංජනී සඳතාරකා | Technology | B C C |
| 436 | | ජේ. සුබෝධා ප්‍රබෝධනී ජයසේන | Arts | A A C |
| 14 | | අයි. කැලුම් මධුෂංක | Maths | A B C |
| 385 | | එච්.එම්. ගයත්‍රී ගායිකා හේරත් | Commerce | A B C |
| 420 | | යූ.ඩී.ජී. චන්දිමා හංසනී කරුණාපාල | Commerce | A A B |
| 207 | | එච්.ඒ. මධුකා සචිනි හෙට්ටිආරච්චි | Arts | A A A |
| 274 | | ටී. දිල්රුක්ෂිකා ප්‍රියදර්ශනී රුබේරු | Arts | A A A |
| 115 | | එම්.ඒ. ධනුජ ගමින්ද | Commerce | A A B |
| 198 | | ඊ.කේ. නිපුනි තක්ෂිලා | Bio | B C C |
| 441 | iv | ඒ.ඒ. සිතාරා මධුමාලි | Bio | B C C |
| 65 | | ඩී.එම්.ජී. කාවින්ද ලක්මාලි | Agriculture | B C F |
| 87 | | ඩබ්.ජේ. හර්ෂ ප්‍රභාත් | Bio | B C S |
| 442 | | ඩබ්. අංජලී නිරාෂා | Maths | B C S |
| 28 | | පී.ජී. විනෝද්‍යා චතුරංගි | Bio | B S S |
| 25 | | ඒ.ඒ. චාරුක දිසානායක | Maths | C C C |
| 167 | | බී.ජී. ඉෂාර මධුරංග | Maths | C C C |
| 363 | i | එච්.එම්. ධම්මික ප්‍රදීප් බණ්ඩාර | Bio | C C C |
| 10 | | එම්.එම්. හංසමාලි ගුණවර්ධන | Bio | C C S |
| 38 | | එම්.ජී. තිළිණ නුවන් චන්ද්‍රරත්න | Bio | C C S |
| 53 | | එච්.පී. හිරන්ත චතුරංග | Commerce | C C S |

| | | | | |
|---|---|---|---|---|
| 123 | | ටී.ඒ. අනූපා අමාවර්ණී තුඩුගල | Maths | C C S |
| 134 | | ජේ.ඒ.කේ. ප්‍රමිත් සඳරුවන් | Maths | C C S |
| 220 | ii | එච්.එම්. හංසිමා එරන්දි රෝෂණී හේරත් | Bio | C C S |
| 221 | | එම්.එච්. හංසනී එරංගිකා | Commerce | C C S |
| 339 | | එච්.එම්. සඳරේනු කුමාරි හේරත් | Agriculture | C S |
| 9 | | ඊ.එම්. සචිනි මනීෂා ජයසූරිය | Maths | C S S |
| 29 | | ඩී.ජී. ලක්මුතු සචිත් වීරසිංහ | Maths | C S S |
| 42 | | එම්.ඩී. මිතුෂි සජ්නා එරන්දි | Bio | C S S |
| 90 | | ඉමාෂා සෙව්වන්දි මැණික්හේවා විදානගේ | Bio | C S S |
| 91 | | ඩබ්ලිව්.ඩබ්ලිව්. දිස්නා හංසනී ඉන්ද්‍රචාපා | Bio | C S S |
| 97 | | ජී.එල්. හෂිනි එරංගා | Maths | C S S |
| 111 | i | එන්.එම්. මධුෂානි | Bio | C S S |
| 441 | v | කේ.ජී. ඉෂාරා මධුවන්ති | Arts | C S S |
| 138 | ii | ඊ.ජී. ළිහිණි පබසරා | Maths | C S S |
| 437 | | ආර්.එම්. තරිඳු රෝහිත රාජපක්ෂ | Maths | C S S |
| 32 | | ආර්.කේ. නිමාෂි අනුරාධා රාමනායක | Bio | S S S |
| 107 | | අමාශා ධනංජනා වීරසිංහ | Maths | S S S |
| 163 | | එච්.එන්. නිපුනි නිසංසලා | Bio | S S S |
| 182 | | රංගිකා මධුෂානි විතානගේ | Maths | S S S |
| 204 | | මධුෂා සෙව්වන්දි අනුත්තරා කළුආරච්චි | Bio | S S S |
| 230 | | ආර්.ඩී. ඉසුරන්දි | Bio | S S S |
| 272 | i | ඩී.එම්. හර්ෂණී හෙලන් | Maths | S S S |



ශ්‍රද්ධා අධ්‍යාපන ශිෂ්‍යත්වලාභී තිළිණි කොගලගා දියණියගේ සිතුවමක්

| | |
|---|---|
| සල් උයනේ මල් පිපිලා සුවඳ | හමන්නේ |
| මහමායා දේවිය පුතු සුරතට | ගන්නේ |
| චාමර සලමින් දෙව් බඹ පිරිස | සිටින්නේ |
| තුන් ලොවට ම සැපත සදන හිරු | පායන්නේ |

© 2016 All Rights Reserved. Shraddha Media Network. No : 369, Hewagama, Kaduwela.
T.P : 0112 571 471 Fax : 0112 548 400 Web : www.shraddha.lk Email : edu@shraddha.lk
www.facebook.com/ShraddhaTV www.youtube.com/ShraddhaTV www.google.com/+ShraddhaTV www.twitter.com/ShraddhaTV